# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,680 - 2010 නොවැම්බර් මස 12 වැනි සිකුරාදා - 2010.11.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1928 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1930 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1930 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1936 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1936 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 166

DRF/21/RECT/3131.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2010 මැයි මස 12 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් හෙට්ටිආරච්චිගේ සමන් හර්ෂජිත් හෙට්ටිආරච්චි ගැහේබ (නි/64910),

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2010 මැයි මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් හෙට්ටිආරච්චිගේ සමන් හර්ෂජිත් හෙට්ටිආරච්චි ගැහේබ (නි/64910)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-218

---

2010 අංක 167

DRF/21/RECT/3140.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2010 මැයි මස 12 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් හේවාගමගේ දොන් සුනිල් කැලිස්ටස් දොන් හේවාගම, ගැහේබ (නි/63611),

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2010 මැයි මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් හේවාගමගේ දොන් සුනිල් කැලිස්ටස් දොන් හේවාගම, ගැහේබ (නි/63611).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-222

---

2010 අංක 168

DRF/21/RECT/3144.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2010 අප්‍රේල් මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් අරඹවෙලගේ දොන් අජිත් කුමාර් විපාරෙ (නි/65056)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-223

2010 අංක 169

DRF/21/RECT/3138.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 අගෝස්තු මස 29 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් පරණමානගේ ප්‍රසන්න දිනේෂ් ද සිල්වා ශ්‍රීලයුවෙබ (නි/65520).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-217

---

2010 අංක 170

DRF/21/RECT/3133.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති
සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 ජුනි මස 01 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් අලෙන්සුපුරගේ බන්දුල ජයසිංහ ගැහේබ (නි/65389).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-220

---

2010 අංක 171

DRF/21/RECT/3134.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති
සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 ජුනි මස 01 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් අසංග නන්දික සිරිවර්ධන ගැහේබ (නි/62796).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

11-221

---

2010 අංක 172

DRF/21/RECT/3132.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2010 ජුනි මස 15 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් සංජීව් මධුරංග කෝට්ටේගොඩ ශ්‍රීලයුසේබ (නි/66963).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11-219

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 173

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එච්. ඩබ්ලිව්. ගුණදාස මහතා 2009 ජනවාරි මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / දිසාපති වශයෙන්.

11-166/1

---

2010 අංක 174

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා 2010 මැයි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

11-165

---

2010 අංක 175

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එන්. ඒ. යූ. කේ. එස්. මිහිඳුකුලසූරිය මහතා 2010 මැයි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / දිසාපති වශයෙන්.

11-166/2

2010 අංක 176

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජේ. ජේ. රත්නසිරි මහතා 2010 මැයි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / දිසාපති වශයෙන්.

11-166/3

---

2010 අංක 177

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

මැණිකේ චන්ද්‍රසිරි මහත්මිය 2010 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ, කර්මාන්ත අංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති) වශයෙන්.

11-164

---

2010 අංක 178

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වැනි පන්තියේ, ඊ. ඒ. සී. ඒකනායක මහතා 2010 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තාක්ෂණ) වශයෙන්.

11-167

---

# වෙනත් පත්කිරීම් ආදිය

2010 අංක 179

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් වෛද්‍ය නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට බලපැවැත්වෙන පරිදි ලුතිතන් නිළයට නිළ උසස් කිරීම් අනුමත කර තිබේ.

(අ) දෙවන ලුතිතන් රණතුංග මුදියන්සේලාගේ දුමින්ද සේනාරත්න, ශ්‍රීලයුවෛබ (නි/65972) - 2009 ඔක්තෝබර් 01 ;
(ආ) දෙවන ලුතිතන් මුතුවාඩිගේ දිනේෂ් පෙරේරා, ශ්‍රීලයුවෛබ (නි/66264) - 2010 ජනවාරි 01 ;
(ඇ) දෙවන ලුතිතන් හෙට්ටි පතිරණගේ පවිත්‍රා උදයංගනී පතිරණ, ශ්‍රීලයුවෛබ (නි/66360) - 2009 දෙසැම්බර් 07 ;
(ඈ) දෙවන ලුතිතන් නැණතුංග ලියනගේ දිලංක චාමර සඳරුවන්, ශ්‍රීලයුවෛබ (නි/66543) - 2010 පෙබරවාරි 02 ;
(ඉ) දෙවන ලුතිතන් සේනානායක මුදියන්සේලාගේ සුනිල් රංජිත් සේනානායක, ශ්‍රීලයුවෛබ (නි/67899) - 2010 ජනවාරි 01 ;
(ඊ) දෙවන ලුතිතන් දිලිප් විජේසිංහ, ශ්‍රීලයුවෛබ (නි/67902) - 2009 අප්‍රේල් 01 ;
(උ) දෙවන ලුතිතන් ජයතිස්සගේ තිලින ශ්‍රීමාල් මධුරංග, ශ්‍රීලයුවෛබ (නි/67904) - 2010 ජූනි 01 ;

ජේ. ජයසූරිය, යූඑස්පී එන්ඩීයූ, පීඑස්සී,
ලුතිතන් ජනරාල්,
යුද්ධ හමුදාධිපති.

2010 අගෝස්තු මස 05 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

11-287/1

2010 අංක 180

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද උසස් කිරීම

පහත නම සඳහන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් වෛද්‍ය නිළධාරි 2008 අප්‍රේල් 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ලුතිතන් නිළයට නිළ උසස් කිරීම අනුමත කර තිබේ.

දෙවන ලුතිතන් කළුබඩල්ගේ ජනිත රුවන් දයානන්ද ශ්‍රීලයුවෛබ (නි/67479).

ජේ ජයසූරිය, යූඑස්පී එන්ඩීයූ පීඑස්සී,
ලුතිතන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2010 ජූනි මස 14 වැනි දින,
යුද හමුදා මූලස්ථානය
කොළඹ.

11-287/2

---

2010 අංක 181

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් වෛද්‍ය නිළධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට බලපැවැත්වෙන පරිදි ලුතිතන් නිලයට නිළ උසස් කිරීම අනුමත කර තිබේ.

(අ) දෙවන ලුතිතන් රත්නවීර පටබැඳිගේ මහී ප්‍රසංග ශ්‍රීලයුවෛබ (නි/67896) 2009 ජනවාරි 20,
(ආ) දෙවන ලුතිතන් ලියන හේවගේ රුසිරු අමරනාත් ප්‍රේමතිලක ශ්‍රීලයුවෛබ (නි/67897) 2009 ඔක්තෝබර් 01.

ජේ ජයසූරිය, යූඑස්පී එන්ඩීයූ පීඑස්සී,
ලුතිතන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2010 ජූනි මස 15 වැනි දින,
යුද හමුදා මූලස්ථානය
කොළඹ.

11-287/3

---

2010 අංක 182

සීමාන්විතයි

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික කපිතන් නිලයට උසස් කිරීම අනුමත කර තිබේ :

(අ) ලුතිතන් බාලපුවඩුගේ ඉරාන් මංජුල මෙන්ඩිස්, ආර්එස්පී, ශ්‍රීලංසිරෙ (නි/64252) - 2003 ජනවාරි මස 15 ;
(ආ) ලුතිතන් ටිකිරි බණ්ඩාගේ පුෂ්ප තරංග දිසානායක, ශ්‍රීලපාහ (නි/65363) - 2004 ජූනි මස 01 ;
(ඇ) ලුතිතන් කොටලිගොඩ කන්දේ ගේනක ආරච්චිලාගේ සුසන්ත උපාලි ගුණවර්ධන, ගරෙ (නි/65335) - 2006 පෙබරවාරි මස 06 ;
(ඈ) ලුතිතන් රණවීර ආරච්චිලාගේ චාමර ඉන්දික රණවීර, ශ්‍රීලයුසේබ (නි/65574) - 2007 පෙබරවාරි මස 06 ;
(ඉ) ලුතිතන් දෙන ගමගේ මාලින්ද ප්‍රභා දයානන්ද, ශ්‍රීලසසබ (නි/65605) - 2007 ජූනි මස 01 ;
(ඊ) ලුතිතන් මාතර ආරච්චිගේ දොන් ගයා විකුම් ප්‍රසන්ජන මාතරආරච්චි, ශ්‍රීලංසිරෙ (නි/65736) - 2008 ජනවාරි මස 19 ;
(උ) ලුතිතන් හන්ගරපිටිය ආරච්චිලාගේ වීරංග අනුෂ බණ්ඩාර, ගැහේබ (විබ) (නි/65879) - 2008 පෙබරවාරි මස 05 ;
(ඌ) ලුතිතන් සෙම්බු කුට්ටිගේ ලසන්ත ප්‍රභාත් කුමාර සිල්වා, ශ්‍රීලංසිරෙ (නි/65595) - 2008 ජූනි මස 01 ;
(එ) ලුතිතන් කොටුවේ වත්තේ ගෙදර උදේනි මංගල ගුණතිලක. ඉසේබ (නි/66320) - 2009 පෙබරවාරි මස 06 ;
(ඒ) ලුතිතන් නිපුන් ගයනාත් කස්තුරිආරච්චි, තොතාඒ (නි/66178) - 2009 මාර්තු මස 01 ;
(ඔ) ලුතිතන් මාරඹගේ ප්‍රභාත් ඉන්දික අමරසේන. ශ්‍රීලයුපොදුසේබ (නි/66064) - 2009 ජූලි මස 18 ;
(ඕ) ලුතිතන් හපුගස්තැන්නගේ ගිහාන් ජානක ජයවීර, ශ්‍රීලංසිරෙ (නි/66096) - 2009 ජූලි මස 18 ;
(ක) ලුතිතන් බාලසූරිය ලේකම්ලාගේ යුනාත් රංගන බාලසූරිය, ඉසෙබ (නි/66357) - 2009 නොවැම්බර් මස 03 ;
(ග) ලුතිතන් ගයනාත් එරංග අලුත්විදිය කෝරාල, කරෙ (නි/66116) - 2010 අප්‍රේල් මස 05 ;
(ජ) ලුතිතන් කැලුම් චමින්ද බණ්ඩාර විජේකෝන්, ශ්‍රීලංසිරෙ (නි/66114) - 2010 අප්‍රේල් මස 05 ;
(ට) ලුතිතන් රත්තෙපිටියේ ගෙදර සුමුදු සම්පත් කුමාර ප්‍රේමරත්න, ශ්‍රීලයුසේබ (නි/66128) - 2010 අප්‍රේල් මස 05 ;
(ඩ) ලුතිතන් කාන්ගර මුදියන්සේලාගේ තිලින රන්දික උලපනේ, ශ්‍රීලයුයුබ (නි/66113) - 2010 අප්‍රේල් මස 05 ;
(ණ) ලුතිතන් සචේතන වික්‍රමරත්න සිරිවර්ධන, ශ්‍රීලපාහ (විබ) (නි/66141) - 2010 අප්‍රේල් මස 05 ;
(ත) ලුතිතන් වන්නිනායක මුදියන්සේලාගේ දුලංග වන්නිනායක, ශ්‍රීලයුපොහේබ (නි/66135) - 2010 අප්‍රේල් මස 05 ;
(ද) ලුතිතන් පහලගෙදර ආනන්ද සම්පත් ජයසේන, ශ්‍රීලපාහ (නි/66120) - 2010 අප්‍රේල් මස 05 ;
(න) ලුතිතන් පිටකෝට්ටේ මෙරින්නගේ සුදීර දෙව්නි පෙරේරා, ශ්‍රීලයුපොදුසේබ (නි/66121) - 2010 අප්‍රේල් මස 05 ;
(ප) ලුතිතන් අච්චහන්දි තුසිත අමරතුංග ද සිල්වා, ශ්‍රීලකාහ (නි/66106) - 2010 අප්‍රේල් මස 05 ;
(බ) ලුතිතන් ලොකු ලියනගේ චරිත් සුදර්ශන කබ්‍රාල්, ශ්‍රීලංඉ (නි/66133) - 2010 අප්‍රේල් මස 05 ;
(ම) ලුතිතන් ගමආරච්චිගේ ආනන්ද ප්‍රියාන් චානක දමයන්ත ගමආරච්චි, යාපාබ (නි/66107) - 2010 අප්‍රේල් මස 05 ;
(ය) ලුතිතන් උඩුවනගේ එරංග රේණුක මුණසිංහ, ශ්‍රීලවියාඉ (නි/66109) - 2010 අප්‍රේල් මස 05 ;
(ර) ලුතිතන් තෙන්නකෝන් මුදියන්සේලාගේ වසන්ත බණ්ඩාර කරුණාරත්න, ශ්‍රීලවියාඉ (නි/66118) - 2010 අප්‍රේල් මස 05 ;
(ල) ලුතිතන් පූජාගොඩ ගෙදර මහේෂ් අසේල කුමාර ගුණසේන, ශ්‍රීලංඉ (නි/66122) - 2010 අප්‍රේල් මස 05 ;
(ව) ලුතිතන් මල්ලාදුර ගෙදර දමිත් චමින්ද සිකුරාජපති, ශ්‍රීලවියාඉ (නි/66123) - 2010 අප්‍රේල් මස 05 ;
(ෂ) ලුතිතන් රසික රන්දෙසිය, ශ්‍රීලසසබ (නි/66126) - 2010 අප්‍රේල් මස 05 ;
(හ) ලුතිතන් රණතුංග මුදියන්සේලාගේ කසුන් තරංග රණතුංග, ශ්‍රීලවියාඉ (නි/66127) - 2010 අප්‍රේල් මස 05 ;

(ල) ලුතිතන් ලන්තුවාහැන්දි නදීක නුවන් ද සිල්වා, ශ්‍රීලකාහ (නි/66131) - 2010 අප්‍රේල් මස 05 ;
(අඅ) ලුතිතන් අර්ජුන උදේෂ් වර්ණකුලසූරිය, ශ්‍රීලකාහ (නි/66134) - 2010 අප්‍රේල් මස 05 ;
(අආ) ලුතිතන් බඩල් මුදහන්දිරම්ලැ ගෙදර ශ්‍යාමින්ද සෝමනාත, ශ්‍රීලවියාඉ (නි/66139) - 2010 අප්‍රේල් මස 05 ;
(අඇ) ලුතිතන් සම්මාදප්පෙරුම මොහොට්ටි අප්පුහාමිලාගේ දොන් වන්න මාතාංග සම්බන්ධප්පෙරුම, ශ්‍රීලවියාඉ (නි/66140) - 2010 අප්‍රේල් මස 05 ;
(අඈ) ලුතිතන් ජයමාන්න මොහොට්ටිගේ දොන් කැලුම් මදුවන්ද ජයමාන්න, ශ්‍රීලංසංබ (නි/66117) - 2010 අප්‍රේල් මස 05 ;
(අඉ) ලුතිතන් වැලිවිට වත්තේ වලව්වේ වික්‍රමසිංහ තිලකරත්න වාසල කුලතුංග මුදියන්සේ රාළහාමිලාගේ නුවන් ධනුෂ්ක බංඩාර වැලිවිට, තොතාජ් (නි/66137) - 2010 අප්‍රේල් මස 05 ;
(අඊ) ලුතිතන් ක්‍රිෂාති නිරෝෂා අබේවික්‍රම, ශ්‍රීලයුකාබ (නි/66112) - 2010 අප්‍රේල් මස 05 ;
(අඋ) ලුතිතන් රාජපක්ෂ සේනාධීර ආරච්චිගේ ජීවනි පබසරා රාජපක්ෂ, ශ්‍රීලයුකාබ (නි/66129) - 2010 අප්‍රේල් මස 05 ;
(අඌ) ලුතිතන් කුමාරගේ මයුර කැටවල සමරසිංහ, ශ්‍රීලසසබ (නි/66183) - 2010 ජූලි මස 10 ;
(අඑ) ලුතිතන් තිළිණ බෝපිටිය, ශ්‍රීලකාහ (නි/66185) - 2010 ජූලි මස 10 ;
(අඒ) ලුතිතන් නුවන් අර්ජුන අබේගුණවර්ධන, ගරෙ (නි/66186) - 2010 ජූලි මස 10 ;
(අඔ) ලුතිතන් හේරත් මුදියන්සේලාගේ චින්තක සඳරුවන් චන්ද්‍රසේකර, විපාරෙ (නි/66187) - 2010 ජූලි මස 10 ;
(අඕ) ලුතිතන් නෙත්තිකුමාරන්නැහේලාගේ මල්හබරල ගෙදර කුෂාන් චන්දන නෙත්තිකුමාර, ශ්‍රීලපාහ (නි/66192) - 2010 ජූලි මස 10 ;
(අක) ලුතිතන් මද්දුම කන්කානම්ගේ සුරංග සම්පත් ප්‍රේමතිලක, ශ්‍රීලයුසේබ (නි/66193) - 2010 ජූලි මස 10 ;
(අග) ලුතිතන් ඒකනායක මුදියාන්සේලාගේ මහින්ද දිසානායක බණ්ඩාර, ශ්‍රීලයුපොදුසේබ (නි/66194) - 2010 ජූලි මස 10 ;
(අජ) ලුතිතන් සංජීව රොෂාන්ත හේවරාජගේ, ශ්‍රීලංසංබ (නි/66197) - 2010 ජූලි මස 10 ;
(අට) ලුතිතන් කලුආරච්චිගේ නිපුන් අනුරංග කරුණානායක, ශ්‍රීලයුපොහේබ (නි/66198) - 2010 ජූලි මස 10 ;
(අඩ) ලුතිතන් ඉලංගන් විරගේ ශිරාන් ගයනාත් පතිරණ, ශ්‍රීලයුපොහේබ (නි/66200) - 2010 ජූලි මස 10 ;
(අණ) ලුතිතන් මුණසිංහගේ අනුෂ්ක ප්‍රියශාන්ත අබේවික්‍රම, ශ්‍රීලංඉ (නි/66042) - 2010 ජූලි මස 10 ;
(අත) ලුතිතන් විතානගේ ප්‍රසන්න සඳරුවන් ශ්‍රීලපාහ (කරෙ) (නි/66043) - 2010 ජූලි මස 10 ;
(අද) ලුතිතන් උපේන්ද්‍ර බණ්ඩාර මාරසිංහ, ශ්‍රීලකාහ (නි/66044) - 2010 ජූලි මස 10 ;
(අන) ලුතිතන් විල්වල ආරච්චිගේ පීටර් ශෙහාන් රංගික පෙරේරා, ශ්‍රීලපාහ (නි/66045) - 2010 ජූලි මස 10 ;
(අප) ලුතිතන් දිසානායක මුදියාන්සේලාගේ සුරංග ලලින්ද කපිල බණ්ඩාර, ශ්‍රීලසසබ (නි/66046) - 2010 ජූලි මස 10 ;
(අබ) ලුතිතන් ගොඩමුණගේ ඇපාගේ නුවන් ඉංදික ඇපා, ශ්‍රීලයුපොහේබ (නි/66048) - 2010 ජූලි මස 10 ;
(අම) ලුතිතන් දසනායක මුදියාන්සේලාගේ චතුර දර්ශන දිසානායක, ගරෙ (නි/66049) - 2010 ජූලි මස 10 ;
(අය) ලුතිතන් මුණසිංහ අර්නෝලිස් අප්පුහාමිලාගේ චින්තක ප්‍රභාෂ්වර මුණසිංහ, ශ්‍රීලංසිරෙ (නි/66051) - 2010 ජූලි මස 10 ;
(අර) ලුතිතන් තල්පාවිලවිදානේ කන්කානම්ගේ සුභාෂ් ඉංදික තල්පාවිල, විපාරෙ (නි/66053) - 2010 ජූලි මස 10 ;
(අල) ලුතිතන් මළලගේ ප්‍රසාද් ධම්මික පීරිස්, ගරෙ (නි/66055) - 2010 ජූලි මස 10 ;
(අව) ලුතිතන් ජයම්පති අභය බණ්ඩාර දෙනියගේ, ශ්‍රීලපාහ (නි/66056) - 2010 ජූලි මස 10 ;
(අස) ලුතිතන් ඒකනායකගේ ඉමාල් චතුරංග ඉසේබ (නි/66272) - 2010 ජූලි මස 11 ;

ජේ. ජයසූරිය, යූඑස්පී එන්ඩීයූ, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2010 ජූලි මස 14 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

11-287/4

---

2010 අංක 183

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 108 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණ අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න වන මම, පහත නම් සඳහන් මහත්ම මහත්මීන් අදාළ හදිසි මරණ පරීක්ෂක කොට්ඨාස සඳහා හදිසි මරණ පරීක්ෂකවරුන් වශයෙන් ද එම ධුරය දරන තාක් කල් අදාළ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරුන් වශයෙන් ද පහත උපලේඛනයේ දැක්වෙන පත්වීම් දින සිට පත් කරමි.

අතාවුද සෙනෙවිරත්න,
අධිකරණ අමාත්‍ය.

2010 ඔක්තෝබර් මස,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

| | නම | ලිපිනය | පත්වීම් දිනය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අධිකරණ කලාපය |
|---|---|---|---|---|---|
| 1. | එස්. මෝගන් මයා. | ක්‍රැස්තෝ නිවස, අරාලි දකුණ, වඩුක්කෝඩායි | 2010.05.01 | චන්කානෙයි | යාපනය |
| 2. | ටී. බී. පී. එල්. ද අල්විස් මිය. | අංක 317, බෝකුන්දර, පිළියන්දල | 2010.05.17 | මාම්පේ-කැස්බෑව | කොළඹ |
| 3. | ඒ. එල්. ඒ. ප්‍රේමලතා මිය. | අංක 92/2එෆ්, ගමඉම පාර, දකුණු හෝකන්දර, හෝකන්දර | 2010.05.17 | තලංගම දකුණ | කොළඹ |

| | නම | ලිපිනය | පත්වීම් දිනය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අධිකරණ කලාපය |
|---|---|---|---|---|---|
| 4. | වී. බාස්කරන් මයා. | මල්ලිකායි, කරනවෙයි නැගෙනහිර, කරවෙඩ්ඩි | 2010.05.24 | කරවෙඩ්ඩි | යාපනය |
| 5. | ජේ. එස්. ශ්‍රීනේවාසන් මයා. | කුතනායි පටුමග, නවාලි උතුර, මනිපායි | 2010.05.24 | සන්දිලිපායි | යාපනය |
| 6. | එම්. උදයශ්‍රී මයා. | අංක 41/3, කොන්දල්දි පටුමඟ, නල්ලූර්, යාපනය | 2010.05.24 | නල්ලූර් | යාපනය |
| 7. | පී. පුබාලලිංගම් මයා. | කෝපායි පාර, උරුම්පිරායි දකුණ, උරුම්පිරායි | 2010.05.24 | කෝපායි | යාපනය |
| 8. | එන්. සසිකලා මිය. | කයිතඩි, නවත්කුලි දකුණ, කයිතඩි | 2010.05.24 | චාවාකච්චේරි | යාපනය |
| 9. | වී. ඩී. ඇන්තලා මිය. | හතරවන හරස් වීදිය, පේදුරුතුඩුව | 2010.05.24 | පේදුරුතුඩුව | යාපනය |
| 10. | ඒ. එන්. ප්‍රේමකුමාර් මයා. | අංක 05, පුංගුඩුතිව් | 2010.05.24 | පුංගුඩුතිව් වයඹ | යාපනය |
| 11. | ආර්. තවමලර් මිය. | කොයිලාමනේ, කොඩිකාමම් | 2010.05.24 | කොඩිකාමම් | යාපනය |
| 12. | එන්. ත්‍යාගරාසා මයා. | කොට්ඨාස අංක 06, නයිනතිව් | 2010.05.24 | නයිනතිව් | යාපනය |
| 13. | එම්. සතීස්කරන් මයා. | මිල් පටුමග, සන්දිලිපායි බටහිර, සන්දිලිපායි | 2010.05.24 | අනයිකොඩ්ඩායි | යාපනය |
| 14. | වී. පවනි මිය. | ටී. තේවාතේවපලන් බාරේ, සිල්ලයි දකුණ වෙට්ටිකුරුචි, පන්දතෙරෙප්පු | 2010.05.24 | පන්දතොරෙප්පු | යාපනය |
| 15. | එන්. රවීන්ද්‍ර කුමාර් මයා. | අංක 8/7, දරාවෙල, දික්ඔය | 2010.06.26 | 319අයි, 319ඒ | නුවරඑළිය |
| 16. | එස්. සිවසුබ්‍රමනියම් මයා. | අංක 76/18, ලේඩි මැක්ලම් ඩ්‍රයිව්, හාවාඑළිය නුවරඑළිය | 2010.06.26 | නුවරඑළිය නගරය හාවාඑළිය, ලේඩි මැක්ලම් ඩ්‍රයිව්, ලෝවර්ස්ලීප් | නුවරඑළිය |
| 17. | ඒ. ජේ. එම්. ෆසීර් මයා. | අංක 123, පරේක් රෝඩ්, හැටන් | 2010.06.26 | වෙල්ලිඔය, 319කේ | නුවරඑළිය |
| 18. | ඩී. එම්. ධර්මසේන මයා. | දඹනැත්ත, කුරුපනාවෙල, උඩුපුස්සැල්ලාව | 2010.06.26 | උඩුපුස්ලැල්ලාව 533ඩී, 533ඊ, 533කේ | නුවරඑළිය |
| 19. | ජී. පී. එස්. දයානි මිය. | අංක 117/9, පංසල පාර, පුණ්ඩළුඔය | 2010.06.26 | මැදකුඹුර, ෆෙයාලන්ඩ් | නුවරඑළිය |
| 20. | වරදන් ධනලෙච්චමී මිය. | මොරාර් ඩිවිෂන්, බගවන්තලාව | 2010.06.26 | බගවන්තලාව, 320එල් කොටියාගල 319ජී, බගවන්තලාව දකුණ, බගවාන 319එන් | නුවරඑළිය |
| 21. | එස්. ලියනපතිරණ මයා. | රදැල්ල වත්ත, නානුඔය | 2010.06.26 | ග්ලාසෝව්, රදැල්ල, එඩින්බරෝ | නුවරඑළිය |
| 22. | ඩබ්. දොරසිංහම් මයා. | හුනුකොටුව වත්ත, කැටබුල | 2010.06.26 | කැටබුල, ක්වීන්ස්බරි, හුනුකොටුව | නුවරඑළිය |
| 23. | එම්. එම්. කාජාමියාන් මයා. | අංක 20, ඩුන්බර් නිවාස සංකීර්ණය, හිජ්ජාපුර-හැටන් | 2010.06.26 | හැටන් නැගෙනහිර 319 | නුවරඑළිය |
| 24. | බී. රුද්‍රසේකරන් මයා. | රාගල ගෲප්, හල්ග්‍රන්ඔය | 2010.06.26 | රාගල 533 | නුවරඑළිය |
| 25. | එම්. නරසිංහ පෙරුමාල් මයා. | මාවුස්සාකැලේ වත්ත, මස්කෙළිය | 2010.06.26 | මස්කෙළිය 320අයි | නුවරඑළිය |
| 26. | එස්. ප්‍රනාන්දු මයා. | ඊ. එම්. ඒ. සෙන්ට් කූම්බස් වත්ත, තලවකැලේ | 2010.06.26 | ඩයගම-ආගරපතන (12-17) | නුවරඑළිය |
| 27. | ආර්. තමිල්සෙල්වන් මයා. | අංක 94, පාර්ක් රෝඩ්, කඳපොළ | 2010.06.26 | කඳපොළ නගරය, කෝට්ලොජ්, පාර්ක් එස්ටේට්, ගල්පාලම | නුවරඑළිය |
| 28. | යූ. ඒ. දිසානායක මයා. | දිසානායක නිවස, රෝහල හන්දිය, මතුරට | 2010.06.26 | පල්ලේගම්පහ, 504ඒ, 550බී, 504ඩී, 504ඊ | නුවරඑළිය |
| 29. | ඩබ්. එච්. එන්. එදිරිසිංහ මයා. | බඹරකැලේ ගෲප්, ලිඳුල | 2010.06.26 | ඩයගම-ආගරපතන (6-11) | නුවරඑළිය |
| 30. | එස්. රාජ්කුමාර් මයා. | මල්දෙමර්, ෆැක්ටරි ඩිවිෂන්, උඩුපුස්සැල්ලාව | 2010.06.26 | ලකී ලෑන්ඩ්, සෙන්ට් මාග්‍රට්, දෙල්මර්, ඕල්ඩ්මර්, එනික් | නුවරඑළිය |
| 31. | එස්. සන්දෙයාගු මයා. | ඊ. එම්. ඒ. ඩෙස්ෆෝඩ් වත්ත, නානුඔය | 2010.06.26 | ඩයගම-ආගරපතන (1-5) | නුවරඑළිය |
| 32. | ටී. ගාන්ති මිය. | අංක 09ඒ, දරාවෙල ජනපදය, දික්ඔය | 2010.06.26 | දික්ඔය දකුණ, ඉන්ගෙස්ට්‍රී | නුවරඑළිය |
| 33. | එම්. ජේ. කේ. දයානන්ද මිය. | වාසනා, පොල්පිටිය, පිටලව | 2010.09.01 | බගවන්තලාව | නුවරඑළිය |
| 34. | කේ. ඒ. ජේ. කොඩිතුවක්කු මයා. | තිස්සවාස, මිහිදාගොඩ, පොරමඩුල්ල, රිකිල්ලගස්කඩ | 2010.09.01 | ගන්නෑව නැගෙනහිර | නුවරඑළිය |
| 35. | එච්. එන්. එල්. පෙරේරා මයා. | අංක 232/සී, මඩුගස්තැන්න, වාසලකෝට්ටේ | 2010.09.01 | දේවහුව | මහනුවර |
| 36. | සී. ටී. බී. හපුඅංග මයා. | අංක 03, අළුගොල්ල, නාලන්ද, මාතලේ | 2010.09.01 | ගගල පල්ලේසිය පත්තුව | මහනුවර |
| 37. | ඩබ්. ඊ. ආර්. එම්. පී. ඒකනායක මයා. | අංක 107, රත්මල්කඩුව, ඉනාමළුව, දඹුල්ල | 2010.09.01 | ඉනාමළුව කෝරළය | මහනුවර |
| 38. | එන්. එස්. වීරසිංහ මයා. | අංක 27, හුණුකැටේ, රත්තොට | 2010.09.01 | අඹන්ගඟ කෝරළය | මහනුවර |

| | නම | ලිපිනය | පත්වීම් දිනය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අධිකරණ කලාපය |
|---|---|---|---|---|---|
| 39. | එම්. ඊ. ඒබ්රෝන් මයා. | අංක 401/ඒ, සරසවිගම පාර, මහකන්ද හිඳගල | 2010.09.01 | මුල්ගම්පල පළාත | මහනුවර |
| 40. | ආර්. ඒ. සමරසේකර මයා. | අංක 46/2, වාවින්න, වත්තේගම | 2010.09.01 | පාතදුම්බර උඩගම්පහ | මහනුවර |
| 41. | වයි. ජී. ජිනදාස මයා. | අංක 208, ඉඩමේගම, වැරැල්ලගම | 2010.09.01 | මැදසියපත්තුව බටහිර | මහනුවර |
| 42. | එස්. එම්. ජේ. එම්. සමරසේකර | මහවැලි වෙළඳ සැල, 13 ඇල, උල්පතගම | 2010.09.01 | මහයාය දකුණ | මහනුවර |
| 43. | එස්. ඩී. බී. විජේකෝන් මයා. | අංක 45/ඩී, වරාපිටිය, කුණ්ඩසාලේ | 2010.09.01 | පාතදුම්බර උගගම්පහ බටහිර | මහනුවර |
| 44. | එල්. ටී. අයි. වජිර් මයා. | අංක 237/ඒ, දෙල්ගස්තැන්න, කුරුගොඩ අකුරණ | 2010.09.01 | හාරිස්පත්තුව උඩගම්පහ 02 | මහනුවර |
| 45. | එස්. එස්. රඹුක්පොත මයා. | අංක 383/2, ළමා උද්‍යාන පාර, තෙල්දෙණිය | 2010.09.01 | පල්ස්පත්තුව නැගෙනහිර | මහනුවර |
| 46. | එල්. බී. ඩබ්. සේනාරත්න මයා. | අංක 202, ලක්සෙවන, බොක්කාවල | 2010.09.01 | ගලසියපත්තුව | මහනුවර |
| 47. | ජී. බී. එල්. රූපසිංහ මයා. | මී වැල්ලාව, මරදන්කඩවල | 2010.09.01 | දකුණු උලගල්ල කෝරළය | අනුරාධපුරය |
| 48. | ටී. එම්. පී. හේමචන්ද්‍ර මයා. | උට්ටිමඩුව, අනුරාධපුරය | 2010.09.01 | උතුරු උලගල්ල කෝරළය | අනුරාධපුරය |
| 49. | ඩී. එන්. අත්තනායක මයා. | අංක 30, මහබුලංකුලම, අනුරාධපුරය | 2010.09.01 | පණ්ඩුලගම-ඇලයාපත්තුව | අනුරාධපුරය |
| 50. | ඊ. එස්. ජයවර්ධන මයා. | නාවක්කුලම, ගාලදිවුල් වැව | 2010.09.01 | උතුරු විලච්චිය කෝරළය | අනුරාධපුරය |
| 51. | ඩී. එම්. ජේ. ඩී. එස්. දිසානායක මයා. | ඉහළ ඕබඩයාගම, කලංකුට්ටිය | 2010.09.01 | නෑගම්පහ කෝරළයේ උතුර | අනුරාධපුරය |
| 52. | ඒ. සරික් මයා. | අංක 399, ප්‍රධාන වීදිය, ඉකිරිගොල්ලෑව වහමල්ගොල්ලෑව | 2010.09.01 | රබෑව-මුස්ලිම් | අනුරාධපුරය |
| 53. | එන්. සුහයිබ්දීන් මයා. | තිඹිරිඅත්තාවෙල, හොරොව්පතාන | 2010.09.01 | හොරොව්පතාන-මුස්ලිම් | අනුරාධපුරය |
| 54. | එම්. ඒ. ආර්. මොහොමඩ් මයා. | ගම්බිරිගස් වැව, අනුරාධපුරය | 2010.09.01 | මධ්‍යම නුවරගම් පළාත මුස්ලිම් | අනුරාධපුරය |
| 55. | ජී. එන්. එන්. ජයතිලක මයා. | සාකේත, පොල්වත්ත, මිල්ලනිය | 2010.09.01 | මුංවත්ත බාගපත්තුව බටහිර | කළුතර |
| 56. | ඩී. එන්. ඩී. අදිකාරම් මයා. | දේශප්‍රිය, එළුවිල, පානදුර | 2010.09.01 | පානදුර මහ රෝහල | කළුතර |
| 57. | එස්. ඒ. සරත් මයා. | අංක 399, ඉහළ නාරගල, ගෝවින්න | 2010.09.01 | ගෝවින්න | කළුතර |
| 58. | එස්. ඒ. කුමසාරු මයා. | පොකුණ පාර, ගොඩපරගහහේන, දකුණු කළුතර | 2010.09.01 | කළුතර තොටමුණ | කළුතර |
| 59. | ටී. එන්. කරුණාතිලක මයා. | අංක 172/19, රාගම පාර, කඩවත | 2010.09.01 | නාරංවල පේරුව | ගම්පහ |
| 60. | එම්. ප්‍රියංකර ලාල් මයා. | අංක 151 සී-2, ගනේමුල්ල පාර, මුරුංගස් හන්දිය, හපුගොඩ, කඳාන | 2010.09.01 | ශික්ෂණ රෝහල, රාගම | ගම්පහ |
| 61. | ජේ. ඒ. කේ. තිලංජන මහතා | අංක 84/1, මැඩිල්ල, බැරගම, අම්බලන්තොට | 2010.08.05 | හම්බන්තොට නාගරික | හම්බන්තොට |
| 62. | එච්. පී. ලයනල් ජයතුංග | "දිමුතු", කැලේවත්ත, කටුවන, හම්බන්තොට | 2010.08.15 | කටුවන කොට්ඨාසය | හම්බන්තොට |
| 63. | ජී. එන්. එච්. ආරියදාස මහත්මිය | අමුවල පාර, කොටාමුල්ල, රත්න-හංගමුව, රත්නපුරය | 2010.06.15 | රද්දැල්ල කොට්ඨාසය | රත්නපුරය |
| 64. | ඩී. ඩබ්. ශාන්ත ලාල් මහතා | අංක 208/6/1, ඉසුරු සිරි, සෙරමික් පාර, බදුවත්ත, ඇහැලියගොඩ | 2010.06.01 | කුරුවිට කොට්ටාසය | රත්නපුරය |
| 65. | ෂන්මුහනාදන් ගනේෂදාස් මහතා | පේච්චිඅම්මන් කෝවිල පාර, ආරයම්පදි, මඩකලපුව | 2010.10.11 | කාත්තන්කුඩි උතුර | මඩකලපුව |
| 66. | කේ. වරදරාජන් මහතා | අංක 42, පාඩුමීන් පටුමඟ, මඩකලපුව | 2010.10.01 | කොට්ටමුනෙයි උතුර | මඩකලපුව |
| 67. | එස්. සුදර්ශන් මහතා | අංක 41/7, දොස්තර තම්බපිල්ලෙයි පටුමඟ, පරණ කල්මුණේ පාර, කල්ලඩි, උප්පොඩෙයි, මඩකලපුව | 2010.10.01 | මඩකලපුව ශික්ෂණ රෝහල | මඩකලපුව |
| 68. | කේ. දේවමනෝහරන් මහතා | තේට්ටාතිවු 02, තේට්ටාතිවු | 2010.10.11 | වෙට්ඩාපාලයම් කොට්ඨාසය | මඩකලපුව |
| 69. | ඒ. මහලිංගම් මහතා | පලුකාමම්, ඩිවිෂන් 01, පෙරියපෝරතිව් | 2010.10.01 | වෙල්ලාවෙලි කොට්ඨාසය | මඩකලපුව |
| 70. | ටී. එම්. මහරූෆ් මහතා | අංක 06, බොරලන්ද පාර, වැලිමඩ | 2010.09.25 | වැලිමඩ නගරය (මුස්ලිම්) | බදුල්ල |
| 71. | එම්. ඩබ්. අයි. අයිරවංශ මහතා | අංක 45/ඩී/04, හොබරියාව, බදුල්ල | 2010.09.25 | ගිරාදුරුකෝට්ටේ | බදුල්ල |
| 72. | ආර්. එම්. සෙනවිරත්න මහතා | අංක 62, "රත්න සෙවන", ගල උඩ, හාලිඇල | 2010.09.25 | ගලඋඩ | බදුල්ල |
| 73. | ඩබ්. ඒ. අනුර වාසල මහතා | අංක 60, අඟුනවිල, මුන්දලම | 2010.10.11 | මුන්දලම | හලාවත |
| 74. | පී. බී. පුෂ්පානන්ද තිලකරත්න මහතා | අංක 355/1, අලංකරේ, මොරගනේ | 2010.09.20 | අංගමුව | කුරුණෑගල |
| 75. | ආර්. එම්. චන්ද්‍රකාන්ති රත්නායක මිය | පැරකුම් මාවත, පල්ලේවෙල, උඩුබද්දාව | 2010.09.20 | කටුගම්පල උතුර | කුරුණෑගල |

| | නම | ලිපිනය | පත්වීම් දිනය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | අධිකරණ කලාපය |
|---|---|---|---|---|---|
| 76. | එච්. ජී. අජන්ත මහතා | අංක 26, ජය උයන, මාස්පොත, කුරුණෑගල | 2010.09.20 | කුඩාගල්බොඩ කෝරළය | කුරුණෑගල |
| 77. | එන්. පී. අජිත් නිශ්ශංක මහතා | අංක 306, කුරුහන්හේනේගම, නෑගොල්ලාගම මහව | 2010.09.20 | කටුවන්නා කෝරළය | කුරුණෑගල |
| 78. | බී. එම්. පී. පී. බන්නාහැක මිය. | අංක 525, බඳුවත්ත, සුන්දරාපොල පාර, යන්තම්පලාව | 2010.09.20 | තිරගන්දහය බටහිර | කුරුණෑගල |
| 79. | ආර්. එච්. කරුණාරත්න මහතා | අංක 4/1, පිටකන්දවත්ත පාර, කදුරු-අංග, වැළඩ | 2010.09.20 | වැළඩ කෝරළය | කුරුණෑගල |
| 80. | ටී. එම්. ජේ. තෙන්නකෝන් මහතා | "ස්වර්ණමාලී " , වැල්ලැව, පොල්ගහවෙල | 2010.09.20 | උඩපොළ ඕතොට නැගෙනහිර | කුරුණෑගල |
| 81. | ඊ. එම්. ජයසේන මහතා | සේනවිලා, දලුපතගම, මකුලෑව, ගල්ගමුව | 2010.09.20 | 45, නැගෙනහිර උතුර | කුරුණෑගල |
| 82. | ආර්. එම්. කීර්තිසේන මහතා | සොමි සෙවන, කුඹුක්කඩවල, මොරගොල්ලාගම | 2010.09.20 | නිකවාගම්පහ | කුරුණෑගල |
| 83. | එම්. ඉන්දික වසන්ත මහතා | අංක 622, බුරුත කැලේ, විජයකටුපොත හලාවත | 2010.09.20 | බත්තුළුඔය | හලාවත |
| 84. | එස්. එන්. පතිරණ මැණිකේ මිය. | ගම්පහ බෙහෙත් ශාලාව, ආරච්චිකට්ටුව | 2010.09.20 | රාජකදළුව | හලාවත |
| 85. | ඒ. ඒ. ජාබීර් මහතා | අංක 5/99, වීරත්තිඩල්, සාවලක්කඩෙයි, කල්මුනේ | 2010.09.01 | නාවින්දවේලි | අම්පාර |
| 86. | ජී. පී. සමන් රවින්ද්‍ර නානායක්කාර මහතා | අංක 26/42, රුහුණුගම, දඩයම්තලාව, අම්පාර | 2010.09.25 | වීරගොඩ | අම්පාර |
| 87. | මොහම්මදු ඉබ්‍රාහිම් නස්රුල් ඉල්ලාම් මහතා | අංක 557/එෆ්/01, එස්. එම්. පාර, මරුදමුනෙයි 02 | 2010.10.11 | මරුදමුනෙයි | අම්පාර |
| 88. | මුහම්මදු ඉස්මයිල් සම්සුදීන් මහතා | අංක 53සී, මධ්‍යම පාර, ආලම්කුළම්, අඩ්ඩාලච්චේනයි | 2010.10.11 | දීඝවාපිය හා ආලම්කුලම් | අම්පාර |
| 89. | කේ. අබ්දුල් ගෆූර් මහතා | අංක 27, මදිරිසා පාර, කල්පිටිමුනේ, කල්මුනේ | 2010.10.01 | නට්පිටිමුනේ | අම්පාර |
| 90. | ඒ. එස්. හුමායික් මහතා | අංක 47, ප්‍රධාන වීදිය, අඩ්ඩාලච්චේනායි 02, අම්පාර | 2010.09.01 | අඩ්ඩාලච්චෙනායි | අම්පාර |
| 91. | එස්. සසිරාජී මහතා | රාසවේල් පාර, තිරුක්කෝවිල් 03, අම්පාර | 2010.09.01 | තිරුක්කෝවිල් | අම්පාර |
| 92. | එම්. එස්. මුහම්මදු නලීම් මහතා | ජාවා පාර, කින්නියා 07 | 2010.10.01 | කින්නියා | ත්‍රිකුණාමලය |
| 93. | සුලෙයිමාන් අල් අමීර් මහතා | කොට්ඨාස අංක 01, පුල්මුඩෙයි, ත්‍රිකුණාමලය | 2010.09.15 | පුල්මුඩේ නාගරික | ත්‍රිකුණාමලය |
| 94. | මාණික්කම් පරරාජසේකරම් මහතා | අංක 12/9, කාවේරිවාසම්, ඒ හාබරම් පාර, ත්‍රිකුණාමලය | 2010.10.01 | ත්‍රිකුණාලමය නාගරික-දෙමළ | ත්‍රිකුණාමලය |
| 95. | වී. ලලිතා නන්දනී මහත්මිය | "පවනි", පිටගල්දෙණිය හන්දිය, පිටගල්දෙණිය කෑගල්ල | 2010.06.01 | පිංදෙණිය | කෑගල්ල |
| 96. | ආර්. බී. රණසිංහ මහතා | අංක 276/3සී, දේවාලය පාර, උතුරු අම්තිරිගල, අම්තිරිගල | 2010.06.01 | අම්තිරිගල | කෑගල්ල |
| 97. | සී. එල්. වයි. අබේරත්න මහතා | "සැනසුම", හවුපේ | 2010.09.20 | පරගොඩ | ගාල්ල |
| 98. | විජේනායක හේමසිරි මහතා | සුදුගලහේන, වඩුවාලිපිටිය උතුර, කහදූව | 2010.09.20 | වැලිවිටිය | ගාල්ල |
| 99. | මෙත්සිරි රත්නායක මහතා | රත්නපාය, ලියනගොඩ, හබරාදූව | 2010.09.20 | ලියනගොඩ | ගාල්ල |
| 100. | කේ. ජී. ටී. බී. ද සිල්වා මහතා | අංක 326, කැබෙල්ලගහවත්ත, ගොඩකන්ද, ගාල්ල | 2010.09.20 | ගොඩකන්ද | ගාල්ල |
| 102. | එස්. එම්. නිහාල් රංජිත් මහතා | අංක 03, මිණිපුරගම, මාලිගාවිල, මොණරාගල | 2010.09.15 | පැල්වත්ත | මොණරාගල |
| 103. | පී. එම්. කරුණාරත්න මහතා | ගල්කොටුව, මැඩියගොල්ල, මාරි අරාව, දඹගල්ල | 2010.09.20 | පොල්ගහගම | මොණරාගල |
| 104. | එච්. එම්. එම්. පතිනායක මිය. | වාසනා, පතිනාගොඩ වත්ත, පුහුල්වැල්ල | 2010.07.01 | කිරින්ද පුහුල්වැල්ල | මාතර |
| 105. | ඩබ්. ඒ. සමරජීව මහතා | දෙනිය ගෙදර, මුරුතමුරේ, හක්මන | 2010.07.01 | හක්මණ | මාතර |
| 106. | මොහොමඩ් මොහොමඩ් ඉම්තියාස් මහතා | විදාන වලව්ව, අංක 21, නයිගල පාර, යෝනක පුර, දික්වැල්ල | 2010.07.01 | දික්වැල්ල | මාතර |

# රජයේ නිවේදන

## සමිති ආඥාපනත

(123 අධිකාරය) සමිති ආඥාපනතේ 3 වැනි හා 4 වැනි වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම, මේ නිවේදනයෙන් -

01. රාජගිරිය, කෝට්ටේ පාර, (තැ. පෙ. 09) අංක 1149 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ස්වාධීන අපරාජිත ආබාධිත සහ අසරණවූවන්ගේ සංසදය නමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

02. සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනතේ අදාළ කිරීම් එකී සමිතියට සීමා කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2010 ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ 03.

11-228

## 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත

1 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ නියමය

1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ 1 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ඩී. ඊ. ඩබ්ලිව්. ගුණසේකර වන මම, මෙම නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අධිකරණ කොට්ඨාස සම්බන්ධයෙන් මේ පනතේ II වැනි කොටසේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු දිනය 2010 මැයි මස 03 වැනි දිනය විය යුතු බව නියම කරමි.

ඩී. ඊ. ඩබ්ලිව්. ගුණසේකර,
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2010 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. නිකවැරටිය අධිකරණ කොට්ඨාසය
2. හෙට්ටිපොළ අධිකරණ කොට්ඨාසය
3. හිඟුරක්ගොඩ අධිකරණ කොට්ඨාසය
4. මහියංගනය අධිකරණ කොට්ඨාසය

11-173

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - ගන්දර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ "29ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ "29ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මාතර ප්‍රසිද්ධ නොතාරිස් මහගමගේ චූලාංගනී අරෝෂිණී විසින් සහතික කරන ලද 2008.06.02 වැනි දිනැති අංක 167 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් බාලසාටු හේවාගේ සැල්වින් සහ බාලසාටු හේවාගේ සංජීව ප්‍රභාත් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් එකී උකස්කර අංක 167 යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් අටදහස් අටසියයයි ශත පනස් දෙක (රු. 2,48,800.52) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.06.02 දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් රුපියල් දෙලක්ෂ හතලිස් අට දහස් අටසියයයි ශත පනස් දෙක (රු. 2,48,800.52) ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ "29එල් " වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් දෙලක්ෂ හතලිස් අට දහස් අටසියයයි ශත පනස් දෙක (රු. 2,48,800.52) ක මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 229 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ "29ඩී" වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, ගන්දර පිහිටි තෙන්නකෝන් වත්ත නමැති ඉඩමේ "ඕ" අක්ෂරය බෙදූ "එල්" අක්ෂරය දරන ඉඩම් කැබැල්ලට 1991.02.12 දිනැති ජේ. පී. අමදෝරු බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 624 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ "එල්-2" දරන ඉඩම් කැබැල්ලට එකී පිඹුර ප්‍රකාරව මායිම්, උතුරට : මෙම ඉඩමේ "ජී" අක්ෂරය දරන ඉඩම් කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ "එම්" අක්ෂරය දරන ඉඩම් කැබැල්ල ද, දකුණට : අඩි පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ "එල්-1" අක්ෂරය දරන ඉඩම් කැබැල්ල ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහ හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 14.5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සෑම සියලු දෙය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 488/67හි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම අංක 7450 පිඹුර ප්‍රකාර නැවත මනින ලද අතර එය පහත පරිදි විස්තර වේ :

එකී ගන්දර පිහිටි තෙන්නකෝන් වත්ත නමැති ඉඩමේ "ඕ" අක්ෂරය බෙදූ "එල් "අක්ෂරය දරන ඉඩම් කැබැල්ලට 1991.02.12 දිනැති ජේ. පී. අමදෝරු බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 624 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ "එල්-2" දරන ඉඩම් කැබැල්ලට 2008.01.21 වැනි දිනැති බලයලත් මිනින්දෝරු එන්. විජේවීර මහතා විසින් මැන සාදන ලද අංක 7450 දරන පිඹුර ප්‍රකාරව මායිම්, උතුරට : මෙම ඉඩමේ "ජී" අක්ෂරය දරන ඉඩම් කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ "එම්" අක්ෂරය දරන ඉඩම් කැබැල්ල වෙන් වන පාර ද, දකුණට : ප්‍රධාන පාරේ සිට ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ "එල් " අක්ෂරයෙන් බෙදා වෙන් කළ "එල්-1" අක්ෂරය දරන ඉඩම් කැබැල්ල ද යන මායිම්

තුළ පිහිටි පර්චස් දහහතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 14.5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සෑම සියලු දෙය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
මාතර.

11-315

---

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.05.15 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඥානා ඒකනායක විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2003.01.06 වැනි දිනැති අංක 3947 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම එස් ඇන්ඩ් එච්. ට්‍රේඩිං සමාගමෙහි හවුල්කරුවන් වන පඬුවාවල කංකානමලාගේ හිරෝමාල් හර්ෂප්‍රිය සහ තෙන්නකෝන් කුරුප්පු මුදියන්සේලාගේ සුමිත් ධම්මික තෙන්නකෝන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3947 දරන උකස්කරය මත 2008.10.26 දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් රුපියල් හතලිස් පන්ලක්ෂයක (රු. 45,00,000) මුදල සඳහා තවදුරටත් පොළිය සමග රුපියල් හැටහතරලක්ෂ හැත්තෑදහස් හත්සිය දොළහයි ශත අනූඅටක (රු. 64,70,712.98) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද. 2008.10.26 දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් රුපියල් හතලිස් පන්ලක්ෂයක (රු. 45,00,000) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් හැටහතරලක්ෂ හැත්තෑදහස් හත්සිය දොළහයි ශත අනූ අටක (රු. 64,70,712.98) මුදල අයකර ගැනීම සඳහා කොළඹ වෙන්දේසිකාර එම්. එස්. ෂොක්මන් සහ සමරවික්‍රම විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඥානා ඒකනායක විසින් ලියා අත්සන් කරන ලද 2003.01.06 දිනැති අංක 3947 දරන උකස්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, තලන්ගම පිහිටා ඇති "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ජී. පී. හස්තනායක විසින් 1995.12.14 දින මැන සාදන ලද අංක 590 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් බී" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : ශාන්ත තෝමස්වත්ත ද, දකුණට : බලයලත් මිනින්දෝරු ජී. ආර්. නානායක්කාර විසින් 1984.09.23 දින මැන සාදන ලද අංක 1090 දරන පිඹුරේ ලොට් 3A සහ 3B සහ බස්නාහිරට : ලොට් C, D සහ අඩි 20ක් පළල පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) හෝ හෙක්ටයාර් 0.202ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේද වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1057/144 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 590 දරන පිඹුරේ නිරූපිත පාරක් සඳහා වෙන් කරන ලද අඩි 20ක් පළල පාර මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්),
ආයතනික ණය - 01

මහජන බැංකුව,
ආයතනික බැංකු අංශය,
ඒ. එන්. සී. එල්. ගොඩනැගිල්ල,
කොළඹ 10.

11-314

---

**මහජන බැංකුව - ගන්දර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රුබසිංහ විසින් සහතික කරන ලද 2005.05.12 වැනි දිනැති 2241 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් විජේවීර ගුණරත්න මහ විදාන මුහන්දිරම්ගේ රත්නසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 2241 යටතේ රුපියල් එක්ලක්ෂ හැටපන්දහස් අසූවයි ශත දොළහක (රු. 1,65,080.12) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.05.12 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් එක්ලක්ෂ හැටපන්දහස් අසූවයි ශත දොළහ (රු. 1,65,080.12) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 "එල් " වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ හැටපන්දහස් අසූවයි ශත දොළහක (රු. 1,65,080.12) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2241 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, ගන්දර පිහිටි තෙන්නකෝන්වත්ත නමැති ඉඩම බෙදූ "ඕ" අක්ෂරය දරන ඉඩම් කැබැල්ලට

1986.11.05 දින එන්. විජේවීර බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 3174 දරන පිඹුරේ "එක්ස් "අක්ෂරය වශයෙන් පිළිබිඹු වන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඩබ්ලිව් සහ වයි අක්ෂර දරන කැබලි ද, දකුණට : මෙම ඉඩමේ ඉසඞ් අක්ෂරය දරන කැබැල්ල ද, බටහිරට : මෙම ඉඩමේ එන් සහ ඒ අක්ෂර දරන කැබලි ද යන මායිම් තුල පිහිටි පර්චස් දහයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියලු දැය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 578/158 හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
නූපේ-මාතර.

11-313

---

## මහජන බැංකුව - ගාල්ල මහවීදිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2006.06.08 වැනි දින ලියා සහතික කරන ලද අංක 698 දරන උකස්කරය සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2007.06.13 වැනි දින ලියා සහතික කරන ලද අංක 1472 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පුස්සවලගේ එඩ්වින් මහතා, පුස්සවලගේ අසංග ගයාන් මහතා යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හැත්තෑදෙදහස් තුන්සිය තිස්හතයි ශත තිස්හතක් (රු. 3,72,337.37) සහ රුපියල් එක්ලක්ෂ අසූතුන්දහස් තුන්සිය පනස්හතයි ශත හතලිස් පහක් (රු. 1,83,357.45) මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.11.14 වැනි දින සිට වර්ෂයකට සියයට දාසයයි දශම හතයි පහ (16.75%) ක් බැගින් රුපියල් තුන්ලක්ෂ හැත්තෑදෙදහස් තුන්සිය තිස්හතයි ශත තිස්හතක (රු. 3,72,337.37) මුදලක් 2009.08.04 වැනි දින සිට වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් රුපියල් එක්ලක්ෂ අසූතුන්දහස් තුන්සිය පනස්හතයි ශත හතලිස් පහක් (රු. 1,83,357.45) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හැත්තෑදෙදහස් තුන්සිය තිස්හතයි ශත තිස්හතක් (රු. 3,72,337.37) සහ රුපියල් එක්ලක්ෂ අසූතුන්දහස් තුන්සිය පනස්හතයි ශත හතලිස් පහක (රු. 1,83,357.45) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 698 සහ 1472 දරන උකස්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කිතුලම්පිටියේ පිහිටි බෙරනියදොලවත්ත හෙවත් බෙරලියදොලවත්ත නමැති ඉඩමේ අංක 6A සහ 6B දරන කැබලි ඒකාබද්ධ කර සැදූ අංක 38 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. එච්. ජී. ඒ. ඒ. ද සිල්වා මහතා විසින් 1985 ජූලි මස 30 හා 31 දිනයන්හි දී ද, අගෝස්තු මස 16 වැනි දින මැන සැදූ අංක 479 දරන පිඹුර ප්‍රකාර (ඔප්පුව ප්‍රකාර 1985.08.19) එකී අංක 38 දරන කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 35 සහ 36 දරන කැබලි ද, නැගෙනහිරට : ගම්සභා පාර ද, දකුණට : බෙරලියදොලවත්ත ද, (රජය මගින් පවරා ගත් වත්තක් මුත් ඔප්පුව ප්‍රකාර මෙම ඉඩමේ කැබැල්ලක් සහ පාර) සහ බස්නාහිරට : මෙම ඉඩමේ අංක 39 දරන අඩි 20ක් පළල පාර ද, යන සතර මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 21.7) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A616/258 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

11-312

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එම්ජී/06/686/එම්ජී1/472.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. එච්. ලියනදේව විසින් සහතික කරන ලද 2007.09.15 දින හා අංක 5004 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මග්ගොන පදිංචි නිශ්ශංක දීපානි සිල්වා, නිශ්ශංක ඕදිරිස් සිල්වා සහ පාණ්ඩිගේ ජේමවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.03.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් එක්දහස් පන්සිය තිස්හතයි ශත

හැටහතක (රු. 2,41,537.67) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5004 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසි පහයි ශත හැත්තෑතුන (රු. 125.73) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණේ දකුණ මග්ගොන බැද්දේ, මාගල්කන්ද පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එල්. සේරසිංහ විසින් සකසන ලද 2007.01.05 දිනැති හා අංක 2007/06 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 1, පර්. 0ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි පස, ගහකොළ ඇතුළු සියලු දේත් සමග වේ.

මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 174/50 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 ඔක්තෝබර් මස 28 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-291/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එම්ජී/06/00279/එම්ජී1/172.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.10.15 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

හොරණ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. ඩබ්. ජයන්ත විසින් සහතික කරන ලද 2005.06.24 දින හා අංක 7135 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ඉංගිරිය පදිංචි දොඹගහපතිරගේ රොස්මි වසන්ත කුමාර සහ හේවාදේවගේ සේපාලි චන්දිමා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ අනූහය දහස් පනස් හයයි ශත දහඅටක (රු. 6,96,056.18) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 7135 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය හතලිස් අටයි ශත තුන (රු. 348.03) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහපත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ, පෝරුවදණ්ඩ උප කාර්යාලයේ ඌරුගල ග්‍රාමයේ පිහිටි දිවුල්පොතහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. සෝමසිරි විසින් සකසන ලද 1993.07.24 වැනි දිනැති (නමුත් ලියාපදිංචිව ඇත්තේ 1993.07.12 ලෙස) අංක 168 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 4 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 25.71 ක් බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි ගහකොළ ඇතුළු සියළු දේත් සමග වේ.

මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 143/201 යටත් ලියාපදිංචි කර ඇත.

තව ද එකී අංක 168 පිඹුරේ දක්වා ඇති කැබලි අංක 11 (අඩි 15ක් පළල හා වෙන්කළ)මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 ඔක්තෝබර් මස 28 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-291/2

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.08 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0170-110621-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. යූ. කැප්පෙටිපොල විසින් සහතික කරන ලද 1997 ඔක්තෝබර් මස 03 දිනැති අංක 12252, ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝදි විසින් සියල්ලම සහතික කරන ලද 1998 ජූලි මස 23 වැනි දිනැති අංක 130, 2000 පෙබරවාරි 24 වැනි දිනැති අංක 412, 2006 ජනවාරි මස 02 වැනි දිනැති අංක 2140 සහ 2002 ජූලි මස 10 වැනි දිනැති අංක 844 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මහනුවර පදිංචි ගුණවර්ධන ලියනගේ නිමල් විජේසිරි ගුණවර්ධන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දොලොස්ලක්ෂ අනූඅටදහස් දෙසිය අසූඑකයි ශත අනූහතරක (රු. 12,98,281.94) මුදලක්, 2009 මැයි මස 25 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 12,98,281.94 මුදල ද, 2009 මැයි මස 26 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 12252, 130, 412, 2140 සහ 844 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව සිය පත්තුව කළුගම්මන රණවන පිහිටි බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් සාදන ලද 1987 දෙසැම්බර් මස 20 සහ 1984 අගෝස්තු මස 12 වැනි දිනැති අංක 1473ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පල්ලේවලව්වේ වත්ත නමැති ඉඩමේ ලොට් 6ඒ ලකුණු කළ (බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් සාදන ලද 1984.08.12 දිනැති අංක 1473 දරන සැලැස්මේ සඳහන් ලොට් 6හි කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 1473ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 6එෆ් (මාර්ග ප්‍රවේශය) ද, නැගෙනහිරට : ඉවුර ද, දකුණට : එකී අංක 1473 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 සහ බස්නාහිරට : එකී සැලැස්මේ සඳහන් ලොට් 6ඩී යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) නොහොත් හෙක්ටයාර් 0.060684 විශාල එකී සැලැස්මේ සඳහන් ලොට් 6එෆ් ලකුණු කළ මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය සමග සහ බිම, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

### දෙවැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ, නාපාන පිහිටි බලයලත් මිනින්දෝරු එකී ඒ. ආර්. එම්. එම්. රත්නායක විසින් සාදන ලද සහ 1998 ඔක්තෝබර් මස 23 වැනි දිනැති අංක 1218 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 2 මත බලයලත් මිනින්දෝරු ඒ. ආර්. එම්. එම්. රත්නායක විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 23 වැනි දින සාදන ලද අතුරු බෙදීමක් වන රෙස්ට්තැරෝ එස්ටේට් හෙවත් පට්ටියතැන්න එස්ටේට් නමැති ඉඩමේ ලොට් 2බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : පට්ටියතැන්න කොළනි මහවැලි ගඟ, ගිණිකොණට : ලොට් 3 ද, නිරිතට : ලොට් 1 සහ 4 සහ වයඹට : එකී අංක 1218 දරන සැලැස්මේ සඳහන් ලොට් 2ඒ ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් නවයයි දශම අටක් (අ. 0, රූ. 1, පර්. 9.8) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

11-276

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මහරගම ශාඛාව
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.05 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0040-01856231-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පෙරේරා විසින් සහතික කරන ලද 2007 ජූලි මස 18 දිනැති අංක 362 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මහරගම ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 13309 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මෙසස් ඉක්ව් ට්‍රේඩ් ඇසෝෂියේට්ස් (පීවීටී) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්කෝටි හැටඑක්ලක්ෂ විසිදහස් අටසිය හැටඑකයි ශත දහහතරක (රු. 5,61,20,861.14) මුදලක්, 2009 ඔක්තෝබර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,61,20,861.14 මුදල ද, 2009 ඔක්තෝබර් මස 31 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 362 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝකන්දර පිහිටි

බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේන විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වෙල්ලංගිරිය එස්ටේට් නමැති හොකන්දර සමගි මාවත ඊඩින් ගාඩ්න්ස් වරිපනම් අංක 428/34 දරන නිවස සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 34 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : ලොට් 33 සහ 29 ද, නැගෙනහිරට : ලොට් 29 ද, දකුණට : ලොට් 101 සහ බස්නාහිරට : ලොට් 40 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව පර්චස් දහහතයි දශම හතයි හයක් (අ. 0, රූ. 0, පර්. 17.76) නොහොත් හෙක්ටයාර් 0.04492ක් විශාල ඉඩම.

ගැණුම්කරුට සහ සිය පෙර කියන ලද සහ ඔවුන්ගේ කුලීකරුවන්, සේවකයන්, කම්කරුවන්, ආගන්තුකයින් සහ සමාන අයිතිවාසිකම් ඇති හෝ ඔවුන් බලය පවරන ලද සියලු වෙනත් පුද්ගලයන්ගේ පූර්ණ සහ නිදහස් අයිතිය, නිදහස, අවසරය සහ බලය ඇතිව පහත විස්තර කරනු ලබන පාරවල් සඳහා වෙන් කිරීම තුළ දිගේ සහ උඩින් බර පැටවූ හෝ නොපැටවූ වාහන ඇති හෝ නැතිව යාමට සහ නැවත යාමට සහ ගැණුම්කරුගේ සහ පෙර කියනලද්දන්ගේ ප්‍රයෝජනය සහ යහපත උදෙසා එකී වෙන් කිරීම් දිගේ සහ උඩින් ජලාපවහන පද්ධති, විදුලි කේබල් සහ වෙනත් උඩු රැහැන් සහ වෙනත් අවශ්‍ය උපක්‍රම යෙදීමට සහ සවිකිරීමට සහ ඉහත විස්තර කරන ලද එකී ඉඩම සහ පරිශ්‍රය භුක්ති විඳීම සහ සම්බන්ධ සියලු කාරණා සඳහා සහ නමුත් එවැනි අයිතිවාසිකම් භාවිතා කිරීම යම්කිසි ආකාරයකින් හෝ ක්‍රමයකින් එවැනි සමාන අයිතිවාසිකම් හිමි අන් අයගේ අයිතීන්ට බාධා නොවන අයුරු විය යුත්තේ ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හොකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වෙල්ලංගිරිය එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 100 (මීටර් 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : පී. පී. සීම් 2473හි සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 8, 7, 6, 5, 4, 3, 2, 1 සහ 113 ද, දකුණට : ලොට් 113 සහ බස්නාහිරට : ලොට් 14, 13, 12, 101, 11, 10 සහ 9 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් නවයයි දශම එකයි එකක් (අ. 0, රූ. 1, පර්. 9.11) නොහොත් හෙක්ටයාර් 0.12421 ක් විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හොකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වෙල්ලංගිරිය එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 101 (මීටර් 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : ලොට් 49, 43, 105, 40, 34, 28, 102, 23, 19 සහ 11 ද, නැගෙනහිරට : ලොට් 100 ද, දකුණට : ලොට් 12, 18, 24, 103, 27, 35, 39, 104, 44, 48 සහ 47 සහ බස්නාහිරට : ලොට් 108, 59, 58 සහ 106 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් පහයි දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 2, පර්. 5.02) නොහොත් හෙක්ටයාර් 0.21504ක් විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හොකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු වෙල්ලංගිරිය එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 106 (මීටර් 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : ලොට් 107, 53, 52 සහ 51 ද, නැගෙනහිරට : ලොට් 51, 50, 49 සහ 101 ද, දකුණට : ලොට් 58, 57 සහ 56 සහ බස්නාහිරට : ලොට් 56. 55, 54 සහ 107 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව පර්චස් විසිහතයි දශම නවයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 27.93) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හොකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වෙල්ලංගිරිය එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 107 (මීටර් 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : පී, පී. කො. 2473හි ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 106 ද, දකුණට : ලොට් 54, 64, 108, 65 සහ 98 සහ බස්නාහිරට : ලොට් 111 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් දහහතයි දශම පහයි පහක් (අ. 0, රූ. 1, පර්. 17.55) නොහොත් හෙක්ටයාර් 0.14556ක් විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හොකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වෙල්ලංගිරිය එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 108 (මීටර් 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : ලොට් 107, 64, 63, 62 සහ 61 ද, නැගෙනහිරට : ලොට් 61, 60, 59, 101, 47 සහ 109 ද, දකුණට : ලොට් 99, 75, 74, 73, 72 සහ 71 සහ බස්නාහිරට : ලොට් 71, 70. 69, 68. 67, 66 සහ 65 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් විසි හයයි දශම තුනයි එකක් (අ. 0, රූ. 1, පර්. 26.31) නොහොත් හෙක්ටයාර් 0.16772ක් විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හොකන්දර පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2003 මැයි මස 9 වැනි දිනැති අංක 1366ජ් දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වෙල්ලංගිරිය එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 109 (මීටර් 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : ලොට් 47 ද, නැගෙනහිරට : ලොට් 112, 76, 77, 78, 79 සහ 80 (වඩාත් නිවැරදිව පාර) සහ ලොට් 79-80 ද, දකුණට : ලොට් 110 සහ බස්නාහිරට : ලොට් 83, 84, 85, 99 සහ 108 ද යන මායිම් තුළ එකී අංක 1366ජ් දරන සැලැස්ම අනුව පර්චස් තිස් නවයයි දශම එකයි අටක් (අ. 0, රූ. 0, පර්. 39.18) නොහොත් හෙක්ටයාර් 0.09910ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

11-275

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව පොදු සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත-සමාගම් ලි. ප. අංක පීකිව් 9)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.09.02 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි

වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගිණුම් අංකය : 0120-01298157-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. පී. කරුණාසේකර දෙකම සහතික කරන ලද 2004 නොවැම්බර් මස 23 දිනැති අංක 965 සහ 2007 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 1337 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මාලබේ පදිංචි නාඹුලුවේ ලියනගේ මියුරු භාසිත ලියනගේ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි දහඅටලක්ෂ අසූඅටදහස් පනස්හයයි ශත හැත්තෑදෙකක (රු. 2,18,88,056.72) මුදලක්, 2009 සැප්තැම්බර් මස 14 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,18,88,056.72 මුදල ද, 2009 සැප්තැම්බර් මස 15 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් ඇත්නම් එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 965 සහ 1337 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ නුගේගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 2003 දෙසැම්බර් මස 08 වැනි දිනැති අංක 4016 දරන සැලැස්මේ නිරූපනය වන පාගොඩ පාර, වරිපනම් අංක 19/2 දරන වැලිකුඹුර නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 30ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 22 1/2 ක් පළල පාර (අංක 3416ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 34) ද, නැගෙනහිරට : පාගොඩ පාර, වරිපනම් අංක 19/1 පරිශ්‍රය (අංක 3416ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 29) ද, දකුණට : පාගොඩ පාර, වරිපනම් අංක 3/4 සහ 3/5 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පාගොඩ පාර වරිපනම් අංක 19/2බී දරන පරිශ්‍රය (අංක 3416ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 31) යන මායිම් තුළ එකී අංක 4016 දරන සැලැස්ම අනුව පර්චස් දහඅටයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.85) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 1971/112හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ එයට අදාළ වෙනත් පොදු අයිතීන් සමග :-

පෙර කී පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ නුගේගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු වී. ඒ. අයි. සේනාරත්න විසින් සාදන ලද 1966 ජූනි මස 27 වැනි දිනැති අංක 3416ඒ දරන සැලැස්මේ නිරූපණය වන වැලිකුඹුර නමැති ඉඩමේ ලොට් 34 ලකුණු කළ (අඩි 23ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 21-26 ද, නැගෙනහිරට : පාගොඩ පාර ද, දකුණට : ලොට් 18, 29-33 සහ බස්නාහිරට : ලොට් 20 යන මායිම් තුළ එකී අංක 3416ඒ දරන සැලැස්ම අනුව පර්චස් විසිනවයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 29.1) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 1971/291හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

11-274/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කුරුඳුවත්ත ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.09.09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0320-30504503-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ආර්. පී. කුමාරි විසින් සහතික කරන ලද 2008 සැප්තැම්බර් මස 24 දිනැති අංක 935 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 05 පදිංචි අනිල් ප්‍රියදර්ශණ ශ්‍රී විජයකුමාර් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකොලොස්ලක්ෂ අනූදෙදහස් තුන්සිය හයයි ශත හැට හයක (රු. 11,92,306.66) මුදලක්, 2009 සැප්තැම්බර් මස 25 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 11,92,306.66 මුදල ද, 2009 සැප්තැම්බර් මස 26 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 935 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, මත්තේගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර

විසින් සාදන ලද 1996 ජනවාරි මස 28 වැනි දිනැති අංක 5958 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අළුබෝගහහේන නමැති ඉඩමේ ලොට් 17බී (බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් සාදන ලද 1982 අප්‍රේල් මස 05 සහ 08 වැනි දිනැති අංක 1007 දරන සැලැස්මේ සඳහන් ලොට් 17හි නිරූපණය වන ඉඩමෙහි අතුරු බෙදීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 17ඒ ද, නැගෙනහිරට : අංක 1007 දරන සැලැස්මේ සඳහන් ලොට් 16 ද, දකුණට : පාර සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පර්චස් නවයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.50) විශාල ඉඩම. මෙය හෝමාගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එත් 243/153 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් සාදන ලද 1996 ජනවාරි මස 28 වැනි දිනැති අංක 5958 දරන සැලැස්මේ ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම සමග යි.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

11-274/1

---

සමාගම් 11

පීවී 108.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඇසෝෂියේටඩ් මෝටර්වේස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1992.12.08 දින සංස්ථාපිත සමාගමක් වන "ඇසෝෂියේටඩ් මෝටර්වේස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්, එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඇසෝෂියේටඩ් මෝටර්වේස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපාහරින බවත් සමාගම විසුරුවා හරින බවත් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-157

---

සමාගම් 11

පී වී 64431.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "වෙස්ට් ලංකා බෝට් බිල්ඩර්ස් ඇන්ඩ් මැරීන් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.06.12 දින සංස්ථාපිත සමාගමක් වන "වෙස්ට් ලංකා බෝට් බිල්ඩර්ස් ඇන්ඩ් මැරීන් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "වෙස්ට් ලංකා බෝට් බිල්ඩර්ස් ඇන්ඩ් මැරීන් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 සැප්තැම්බර් මස 15 දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-158

---

සමාගම් 11

පී වී 6901.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එස්. එම්. ආර්. එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1994.06.09 දින සංස්ථාපිත සමාගමක් වන " එස්. එම්. ආර්. එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, " එස්. එම්. ආර්. එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් " නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-224

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - තිස්සමහාරාමය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වසන්ත දිසානායක.

2010.07.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. එම්. මහසුම් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.05.29 සහ අංක 5571 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වසන්ත දිසානායක යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දසලක්ෂ දෙදහස් දෙසිය හැත්තෑහතයි ශත හතලිස්තුන (රු. 10,02,277.43) ක මුදලක් 2010.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,02,277.43ක මුදලට 2010.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5571 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, අගුල්මඩුවහි පිහිටි සිත්තරගේ වත්ත හෙවත් තුත්තිරි පිට්ටනිය නමැති ඉඩමට බලයලත් මානක එච්. පී. පී. ජයවර්ධන විසින් මැන සාදන ලද අංක 1598 සහ 1994 ජනවාරි මස 02 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : එම ඉඩමේ ලොට් 2න් ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 5න් ද, දකුණට : නාරංගහ හේනෙන් සහ ලොට් 06 න් ද (කොටසක්) සහ බස්නාහිරට : ලොට් 4 සහ 5 න් ද, (අඩි 10 පළලැති පාර) මායිම් වූ පර්චස් තිස්අටයි දශම හයයි පහ (අ. 0, රූ. 0, පර්. 38.65) හෝ හෙක්ටයාර් 0.0978ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, වැව්ලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 248/220 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-345/8

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - තලංගම ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කුමාර වීරසිරි වැලිගම හෙවත් වැලිගමගේ වීරසිරි කුමාර.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.12.04 සහ අංක 4695 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුමාර වීරසිරි වැලිගම හෙවත් වැලිගමගේ වීරසිරි කුමාර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිතුන්ලක්ෂ විසිපන්දහස් දාහතරයි ශත අනූපහ (රු. 23,25,014.95) ක මුදලක් 2010.04.14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 23,25,014.95ක මුදලට 2010.04.15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4695 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ (අතුරුගිරිය ඒකකයෙහි) අතුරුගිරියේ පිහිටි කහටගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක යූ. එල්. එන්. ටී. චන්දන විසින් මැන සාදන ලද අංක 4093 සහ 2008 පෙබරවාරි මස 23 වැනි දින දරන පිඹුරු ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : එම්. ප්‍රේමසිරි හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 2339ට අයත් ලොට් 2න් සහ බලයලත් මානක යූ. එල්. එන්. ටී. චන්දන විසින් මැන සාදන ලද 2005 ජූලි මස 15 වැනි දින සහ අංක 3052 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2න් ද මායිම් වූ පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 13.5) විශාල ඉඩම අංක 4093 දරන පිඹුරට අයත් ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-345/7

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ගල්කිස්ස ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මහේෂ් අබේවික්‍රම.

2010.09.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2003.03.09 සහ අංක 5747 සහ 2004.07.12 සහ අංක 6503 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහේෂ් අබේවික්‍රම යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්අටලක්ෂ අනූදෙදහස් හත්සිය අනූදෙකයි ශත විසිතුන (රු. 48,92,792.23) ක මුදලක් 2010.02.07 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 48,92,792.23ක මුදලට 2010.02.08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5747 සහ 6503 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මිරිහාන, එක්වත්ත පාරේ, වරිපනම් අංක 42 සහ 42/1 ගල්පොත්තවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් පිළියෙල කරනල ද 1986.06.23 දිනැති අංක 2501 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, ඊසානදිගට : එක්වත්ත පාරේ, වරිපනම් අංක 44න් සහ සිරිසේනට අයිති ඉඩමෙන් ද, ගිණිකොණට : ලොට් 2න් ද, නිරිතදිගට : ලොට් 4 සහ 5න් ද සහ වයඹට : ලොට් 6න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතර (අ. 0, රූ. 0, පර්. 15.4) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1888/04 යටතේ ලියාපදිංචි කර ඇත.

මිරිහාන එක්වත්ත පාරේ, ගල්පොත්තවත්ත නමැති ඉඩමේ අංක 2501 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 6 (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කරන ලද කොටස) දරන ඉඩම් කොටසට මායිම්, ඊසානදිගට : එක්වත්ත පාරෙන් ද, ගිණිකොණට : ලොට් 1න් ද, නිරිතදිගට : ලොට් 5න් ද සහ වයඹට : ලොට් බී දාබරේට අයිති ඉඩමෙන් ද මායිම් වූ පර්චස් එක (අ. 0, රූ. 0, පර්. 1) ක් විශාල ඉඩම වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1888/05 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

11-345/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මාතලේ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රාසලිංගම් පාස්කරන් නොහොත් බාස්කරන්.

2010.08.27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.11.28 දින සහ අංක 1641 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාසලිංගම් පාස්කරන් නොහොත් බාස්කරන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන්ලක්ෂ අනූතුන්දහස් දෙසිය පහයි ශත පනස්තුන (රු. 13,93,205.53) ක මුදලක් 2010.06.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,93,205.53ක මුදලට 2010.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1641 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නගරයේ නගර සභා සීමාවේ, ගොන්ගවෙල පාරේ, වරිපනම් අංක 86 සහ 88 නමැති ඉඩමට බලයලත් මානක කේ. ඕ. පෙරේරා විසින් 1976.02.07 දින මැන සාදන ලද පිඹුරු අංක 7035 හි ලොට් අංක 1 නමැති ඉඩමෙහි උතුරට : වරිපනම් අංක 90න් ද, නැගෙනහිරට : වරිපනම් අංක 18න් සහ කාණුවෙන් ද, දකුණට : ලොට් 2න් ද සහ බටහිරට : ගොන්ගවෙල පාරෙන් ද මායිම් වූ

පර්චස් එකයි දශම පහ (අ. 0. රූ. 0, පර්. 1.5)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 96/230 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම මෑතකදී කරන ලද මැනීමකට අනුව පහත පරිදි විස්තර කෙරේ :-

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නගරයේ නගර සභා සීමාවේ, ගොන්ගවෙල පාරේ, වරිපනම් අංක 88 නමැති ඉඩමට බලයලත් මානක ඒ. ජී. ඩබ්. ගිරාගම විසින් 2007.12.13 දින මැන සාදන ලද පිඹුරු අංක 6478 නමැති ඉඩමෙහි උතුරට : වරිපනම් අංක 90න් ද, නැගෙනහිරට : සුරේෂ් හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : වරිපනම් අංක 86න් ද සහ බටහිරට : ගොන්ගවෙල පාරෙන් ද මායිම් වූ පර්චස් එකයි දශම පහ (අ. 0. රූ. 0, පර්. 1.5)ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

11-345/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

තේවාරතන්ත්‍රිගේ දුෂාන්ත ප්‍රිමල් ප්‍රනාන්දු,
හේවාදූව වත්තේගමගේ සංජීවා ප්‍රියදර්ශනී.
හේවාදූව වත්තේගමගේ සුදේශ් දර්ශන සහ
හේවාදූව වත්තේගමගේ සුරංජි රුවන්මාලී.

2010.09.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2002.09.11 දින සහ අංක 1105 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තේවාරතන්ත්‍රිගේ දුෂාන්ත ප්‍රිමල් ප්‍රනාන්දු, හේවාදූව වත්තේගමගේ සංජීවා ප්‍රියදර්ශනී, හේවාදූව වත්තේගමගේ සුදේශ් දර්ශන සහ හේවාදූව වත්තේගමගේ සුරංජි රුවන්මාලී යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙලක්ෂ අසූහතරදහස් එකසිය අටයි ශත තිස්පහ (රු. 2,84,108.35) ක මුදලක් 2010.07.16 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,84,108.35ක මුදලට 2010.07.17 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1105 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, පැලියගොඩ නගර සභා සීමාව තුළ පැලියගොඩ පිහිටි පරාක්‍රම මාවතේ, වරිපනම් අංක 98. 98/1, 98/2, 98/3, 98/4, 98/5, 98/6, 98/7, 98/9, 98/10, 98/11 සහ 100 දරන ඇස්මෙස්ට්‍රියවත්ත දරන ඉඩමට බලයලත් මානක එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද 1984.04.07 දිනැති අංක 7671 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන උතුරට : පරාක්‍රම මාවතේ, වරිපනම් අංක 96 දරන ලංකා පෙන්සිල් කම්පනි ලිමිටඩ් හි පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : පරාක්‍රම මාවතේ වරිපනම් අංක 96 දරන ලංකා පෙන්සිල් කම්පනි ලිමිටඩ් හි පරිශ්‍රයෙන් ද, දකුණට : පරාක්‍රම මාවතෙන්, පාරෙන් සහ පරාක්‍රම මාවතේ, වරිපනම් අංක 102/5 දරන පරිශ්‍රයෙන් ද සහ බස්නාහිරට : පාරෙන් සහ ලෙස්ලි ආර්. ෆොන්සේකා සහ අනෙක් ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 7671 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඅටයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 28.50)ක් විශාල ඉඩම වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 669/108 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-345/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මොරටුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සුනිල් බස්නායක සහ හේවා දේවගේ ප්‍රියන්ති ප්‍රනාන්දු.

2010.09.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.10.12 සහ 2007.12.17 දිනයන් සහ පිළිවෙලින් අංක 8057 සහ 8166 දරන බැඳුම්කර යටතේ (පහත පළවන උපලේඛනයේ සඳහන් පරිදි) 2010.05.31 දිනට රුපියල් විසිලක්ෂ අනූදෙදහස් හැටදෙකයි ශත

අනූපහක (රු. 20,92,062.95) අයවිය යුතු මුදල් ගෙවීම සුනිල් බස්නායක සහ හේවා දේවගේ ප්‍රියන්ති ප්‍රනාන්දු යන අයවළුන් ණයකරුවන් හැටියට ද,

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 1997.10.12, 2003.09.24 සහ 2006.09.15 දිනැති සහ පිළිවෙලින් අංක 2967, 6036 සහ 7590 දරන බැඳුම්කර යටතේ (පහත දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) 2010.05.31 දිනට රුපියල් එකොලොස් ලක්ෂ හාරදහස් තුන්සිය හැටපහයි ශත හැත්තෑපහ (රු. 11,04,365.75)ක අයවිය යුතු මුදල් ගෙවීම සුනිල් බස්නායක (තනි අයිතිකරු බස්නායක ලී වෙළඳ සැල) යන අය ණයකරු හැටියට ද,

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 1997.10.12, 2003.09.24 සහ 2006.09.15 දින සහ පිළිවෙලින් අංක 2967, 6036 සහ 7590 දරන බැඳුම්කර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2008.10.30 දිනැති අංක 2714 දරන බැඳුම්කර යටතේ (පහත දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) 2010.05.31 දිනට රුපියල් හතලිස්හයලක්ෂ තිස්හයදහස් හයසිය හැත්තෑනමයයි ශත අනූඑක (රු. 46,36,679.91) ක අයවිය යුතු මුදල් ගෙවීම සුනිල් බස්නායක (තනි අයිතිකරු බස්නායක ලී වෙළඳ සැල) යන අය ණයකරු හැටියට ද,

පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හැත්තෑ අටලක්ෂ තිස්තුන්දහස් එකසිය අටයි ශත හැටඑක (රු. 78,33,108.61) ක මුළු මුදලක් 2010.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 78,33,108.61ක මුදලට 2010.06.01 වැනි දින සිට විකිණීමේ දින දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 8057, 8166, 2967, 6036, 7590, 2713 සහ 2714 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පියරත්න මුතුකුමාරන මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ කටුකුරුන්ද, කටුකුරුන්ද පාරේ, කොරමදන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. එස්. සී. විතානගේ විසින් මැන සාදන ලද 2007.06.28 දින සහ අංක 918 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 1 දරන කොටස වන උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 2න් ද, දකුණට : ලොට් 3න් සහ බස්නාහිරට : කටුකුරුන්ද පාරෙන් ද මායිම් වූ පර්චස් එකොලහයි දශම හතයි අට (අ. 0, රූ. 0, පර්. 11.78) ක් විශාලත්වය ඇති ඉඩම සහ සියලු දේත් සමග වේ.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ මොරටුවැල්ල, ෆ්‍රේසර් ඇවනිව්, වරිපනම් අංක 26/5 නමැති ඉඩමට බලයලත් මානක ඒ. සී. එස්. විතානගේ විසින් මැන සාදන ලද 1994.11.17 දින සහ අංක 155 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 2 දරන කොටස වන උතුරට : පිඹුරු අංක 155 හි ලොට් 1න් ද, නැගෙනහිරට : අලුත් ගාලු පාරෙන් ද, දකුණට : ෆ්‍රේසර් පාරේ, වරිපනම් අංක 43/20න් ද, සහ බස්නාහිරට : දුම්රිය පාරෙන් ද මායිම් වූ පර්චස් හයයි දශම හයයි බින්දුවයි (අ. 0, රූ. 0, පර්. 6.60)ක් විශාලත්වය ඇති ඉඩම සහ සියලු දේත් සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2035/64 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

11-345/4

---

## මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ විසින් සහතික කරන ලද 2008.07.24 දින අංක 8191 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම අංගොඩ විදානලාගේ ජීවක ප්‍රසන්න ඩයස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 8191 දරන උකස් බැඳුම්කරය මත දැනට (1) රුපියල් නවලක්ෂ අසූදහස් පන්සිය විසිඅටයි ශත අනූදෙකක (රු. 9,80,528.92), රුපියල් පන්ලක්ෂයක් (රු. 5,00,000) වූ මුදලක් ද මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

2009.04.29 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා (1) රුපියල් නවලක්ෂ අසූදහස් පන්සිය විසිඅටයි ශත අනූ දෙකක (රු. 9,80,528.92) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහතරක (24%) තවදුරටත් වූ පොළියක් ද සහ (2) 2009.05.28 දින සිට වෙන්දේසි දිනය දක්වා රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිහතක (27%) පොළියක් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් (ඇත්නම්) එම ගෙවීම් අඩු කිරීමෙන් පසු සහ විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු සමග එකී රුපියල් නවලක්ෂ අසූදහස් පන්සිය විසිඅටයි ශත අනූදෙකක් (රු. 9,80,528.92) (2) රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) වූ මුදලක් ද අයකර ගැනීම සඳහා අංක 8191 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්වින් පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටියි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සීමාව තුළ පිහිටියා වූ ද බලයලත් මිනින්දෝරු ඩී. එම්. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2000.01.06 වැනි දින අංක 24

දරන පිඹුරේ ලොට් අංක "ඒ " ලෙස නිරූපණය කර ඇත්තා වූ ද උතුරට : ගල්පොත පාර ද, නැගෙනහිරට : අංක 24 දරන පිඹුරේ ලොට් අංක 2 සහ ලොට් අංක 4 ද, දකුණට : එම්. ඊ. පී. මෙන්ඩිස් යන අයගේ අනුප්‍රාප්තිකයන් විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, බටහිරට : කේ. එල්. ප්‍රනාන්දු මහත්මිය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද යන මායිම් තුළ පිහිටියා වූ ද, දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එම් 2483/66 යන අංකය යටතේ ලියාපදිංචි වී ඇති එකී අංක 24 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතක් වූ (අ. 0, රූ. 0, පර්. 7) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ද ඒ මත වූ ගොඩනැගිලි, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම නැවත බෙදා වෙන්කළ අතර එම උප බෙදුම්කළ ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත :-

ඉහත කී වරිපනම් අංක 11 සහ 11/1 දරන මොරටුව මහ නගර සභා සීමාව තුළ පිහිටි ටී. සී. ආර්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1970.07.12 දින අංක 112 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති උතුරට : ගල්පොත පාර ද, නැගෙනහිරට : නගර සභාවට අයත් වේල්ල ද, දකුණට : වරිපනම් අංක 25 දරන එම්. එන්. ඒ. මෙන්ඩිස් විසින් භුක්ති විඳින ඉඩම ද, බටහිරට : වරිපනම් අංක 15 දරන කේ. එස්. ජේ. ප්‍රනාන්දු විසින් භුක්ති විඳින ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 112 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.25) වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

කලාපීය කළමනාකරු,
කොළඹ දකුණ.

මහජන බැංකුව,
කලාප මූලස්ථානය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

11-316

---

## මහජන බැංකුව - සුදුවැල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006 නොවැම්බර් මස 17 වැනි දින පැවති රැස්වීමේ දී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ විසින් සහතික කරන ලද අංක 6068 සහ 2000.06.08 දින දරන උකස් බැඳුම්කරය හා අංක 6186 හා 2000.10.06 දින දරන බැඳුම්කර මත ගෙවීම් තුරෙයිරත්නම් විනෝහරන් විසින් පැහැර හැර ඇති බැවින් එකී අංක 6068 දරන එකී බැඳුම්කරය හා අංක 6181 දරන බැඳුම්කරය මත පිළිවෙලින් රුපියල් පන්ලක්ෂ අසූහත් දහස් පන්සිය එකොලහයි ශත හතලිහක් (රු. 5,87,511.40) හා රුපියල් එක්ලක්ෂ හතලිස් අට දහස් අසූ හයයි ශත දාහතක් (රු. 1,48,086.17) වන මුදල මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එකී රුපියල් පන්ලක්ෂ අසූහත් දහස් පන්සිය එකොලහයි ශත හතලිහක් (රු. 5,87,511.40) හා රුපියල් එක්ලක්ෂ හතලිස් අට දහස් අසූ හයයි ශත දාහතක් (රු. 1,48,086.17) වන මුදල මත පිළිවෙලින් 2000.06.08 හා 2000.10.06 දිනවල සිට විකිණීමේ දිනය තෙක් එකී රුපියල් පන්ලක්ෂ අසූහත් දහස් පන්සිය එකොලහයි ශත හතලිහක් (රු. 5,87,511.40) හා රුපියල් එක්ලක්ෂ හතලිස් අටදහස් අසූ හයයි ශත දාහතක් (රු. 1,48,086.17) වන මුදල මත වර්ෂයකට සියයට දාහතර (14%) බැගින් තවදුරටත් පොළිය ද, විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තු ද, එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 6068 දරන උකස් ඔප්පුව සහ අංක 6186 දරන උකස් ඔප්පුව යටතේ එකී බැංකුවට උකස් කරන ලද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, පැරිස් කල්කුඩා කෝරළේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. රත්නරාජා විසින් සාදන ලද අංක කේ. 49 සහ 1980.12.31 දින දරන බෙදුම් පිඹුරේ නිරූපණය කර ඇති ලොට් 7 දරන අක්කර පහක (අ. 5, රූ. 0, පර්. 0) විශාලත්වයකින් යුතු බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටියේ මැද තිබෙන අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල බෙදා වෙන් කරන ලද මෙම කොටසට මායිම්, උතුරට සහ දකුණට : විකුණුම්කරුට අයත් ඉතිරි දේපළ ද, නැගෙනහිරට : සංචාරක මණ්ඩල පාර ද, බස්නාහිරට : පටුමගක් සඳහා වෙන් කරන ලද ඉහත කී පිඹුරේ ලොට් 5 ද මායිම් වූ ඉඩම් කට්ටිය සමග ඉහත කී සම්පූර්ණ ඉඩම එහි අනුබද්ධිතයන් ද සමග මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 91/43හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී බෙදා වෙන් කරන ලද මැද කොටස මැතදී කරන ලද මිනුමක් අනුව බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් සාදන ලද අංක ඒ. එස්./95/1051 හා 1995.03.02 දින දරන පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

ඉහත කී කල්කුඩා හි පිහිටි මැද කොටසේ ලොට් 7 නමැති ඉඩමේ ඉහත කී අංක ඒ.එස්/95/105 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපණය කර ඇති බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කට්ටිය වන මෙයට මායිම්, උතුරට : ජෝශප් නෝමන් සැමුවෙල් ඉන්පෙච්ට අයත් ඉඩම ද, නැගෙනහිරට : සංචාරක මණ්ඩල පාර ද, දකුණට : ජෝශප් නෝමන් සැමුවෙල් ඉන්පෙච් ට අයත් ඉඩම ද, බස්නාහිරට : පටුමගක් සඳහා රක්ෂිතය ද මායිම් වූ අක්කර දෙක (අ. 2, රූ. 0, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.809 විශාල ඉඩම සහ එහි තිබෙන ගොඩනැගිලි සහ අන් සෑම සියලු දේත් වේ. මෙය ජී 161/234හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාපය - 01.

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය
බටහිර කලාපය 01,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

11-318

### මහජන බැංකුව - ජා-ඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2009 නොවැම්බර් මස 27 වැනි දින පැවති රැස්වීමේ දී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2005.12.19 වැනි දිනැති අංක 2823 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, තුවාන් ෂියාඩ් සම්සුදීන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසිඑක්ලක්ෂ හැටඑක්දහස් නවසිය අනූහතයි ශත අසූ දෙකක (රු. 21,61,997.82) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.07.20 වැනි දින සිට වර්ෂයකට 16.5% බැගින් රුපියල් විසිඑක්ලක්ෂ හැටඑක් දහස් නවසිය අනූහතයි ශත අසූ දෙකක (රු. 21,61,997.82) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා ආදල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් විසිඑක්ලක්ෂ හැටඑක් දහස් නවසිය අනූහතයි ශත අසූ දෙකක (රු. 21,61,997.82) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 2823 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඒකල කුරුඳුවත්ත ගමේ පිහිටි "කණුවනවත්ත නොහොත් මොරෙස්වත්ත නොහොත් හෝන්කාර්සල් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. එඩ්වඩ් විසින් 2005.02.04 දින සකස් කරන ලද අංක 3623ඒ පිඹුරට අනුව ලොට් අංක 08ට මායිම්, උතුරට : ලොට් අංක 07, නැගෙනහිරට : පාර, දකුණට : ලොට් අංක 09, බස්නාහිරට : ලොට් අංක 28 දරන පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 192/236 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත පිඹුරේ මාර්ගය සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

11-320

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මොහොමඩ් ඊබ්‍රහීම් මොහොමඩ් රාසීක්.

2010.04.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2005.07.27 දිනැති සහ අංක 7062 දරන බැඳුම්කරය යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2008.03.03 සහ 2009.03.18 දිනැති සහ පිළිවෙළින් අංක 3111 සහ 3358 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ඊබ්‍රහීම් මොහොමඩ් රාසීක් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිහත්ලක්ෂ හැටඑක්දහස් තුන්සිය අනූපහයි ශත තිස්එකක (රු. 27,61,395.31) ක මුදලක් 2010.01.08 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 27,61,395.31 ක මුදලට 2010.01.09 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 7062, 3111 සහ 3358 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරන ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (නමුත් කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, මාකොල උප කාර්යාලය තුල ගෝනවල පිහිටි හුණුකඩේ පාරේ, වරිපනම් අංක 46/5 දරන ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. ඩී. වයි. ද සිල්වා විසින් පිළියෙල කරන ලද 1991.08.08 දිනැති අංක 1631/බී දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් බී නමැති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 124 හි ලොට් අංක 5 හි ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : අඩි 10 ක් පළල පාරෙන් ද, දකුණට සහ බස්නාහිරට : පිඹුරු අංක 124 හි ලොට් 5 හි ඉතිරි කොටසින් ද මායිම් වූ එකී අංක 1631/බී දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහතුනයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.35) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 486/292 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම බලයලත් මානක ඒ. ආර්. සිල්වා විසින් 2005.06.18 වැනි දින මැන සාදන ලද අංක 2129 දරන පිඹුර ප්‍රකාරව කරන ලද නැවත මැනීමකට අනුව මෙසේ විස්තර වේ :-

ඉහත කී ගෝනවල පිහිටි, හුණුකඩේ පාරේ, වරිපනම් අංක 46/5 දරන ගොරකගහවත්ත නමැති ඉඩමේ එකී අංක 2129 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක බී 1 නමැති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 124 හි ලොට් අංක 5 හි කොටසකින් සහ කොස්කුඹුර පාරේ, වරිපනම් අංක 414/5බී සහ 414/5 කිව් වලින් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : මූස්ජිඩුල් සලාම්ගේ ඉඩමෙන් සහ පාරෙන් ද, බස්නාහිරට : අඩි පාරෙන්ද මායිම් වූ එකී අංක 2129 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහතුනයි දශම තුනයි එකක් (අ. 0, රූ. 0, පර්. 13.31) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් වේ.

ඉහත කී අංක 7062 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ සහ අංක 3111 සහ 3358 දරන උකස් බැඳුම්කරවල දෙවැනි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

11-345/1

---

## මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.22 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී :-

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා විසින් සහතික කරන ලද 2007.03.26 දින අංක 4014 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ජාගොඩගේ පාලිත රත්නපාල යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4014 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් හතර මිලියන තුන්ලක්ෂ අනූපන්දහස් හත්සිය එකොළහයි ශත හැට අටක (රු. 43,95,711.68) මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

2009.05.22 දින සිට වෙන්දේසි දිනය දක්වා රුපියල් හතර මිලියන තුන්ලක්ෂ අනූපන්දහස් හත්සිය එකොළහයි ශත හැට අටක රු. 43,95,711.68 මුදලක් සඳහා වර්ෂයකට වර්ෂයකට සියයට දහනවයයි දශම පහක (19.5%) තවදුරටත් වූ පොලියක් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසු සහ විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමඟ රුපියල් හතර මිලියන තුන්ලක්ෂ අනූපන් දහස් හත්සිය එකොළහයි ශත හැට අටක (රු. 4,395,711.68) මුදලක් අයකර ගැනීම සඳහා 2007.03.26 දින අංක 4014 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්වින් පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටියි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සීමාව තුළ ගංගොඩවිල පිහිටියා වූ ද බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. හීන්දෙනිය විසින් මැන සාදන ලද 2005 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 2713 දරන පිඹුරේ ලොට් "ඒ " ලෙස ලකුණුකර ඇත්තා වූ ද පිටත සුභද්‍රාරාම පාර, 2 වැනි පටුමගේ වරිපනම් අංක 20 දරන සහ 'ගානෙලන්දෙවත්ත' යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන්නා වූ ද උතුරට : (අඩි 12ක් පළල මාර්ගයට වෙන්කළ ඉඩම් කොටස වූ) අංක 2712 දරන පිඹුරේ ලොට් අංක 1 සහ අංක 671 දරන පිඹුරේ ලොට් "ඒ " නමැති කොටස ද, නැගෙනහිරට : දෙවැනි පටුමගේ වරිපනම් අංක 15 දරන පරිශ්‍රය ද, දකුණට : එම ඉඩමේ ලොට් බී යන කොටස ද, බටහිරට : 2 වැනි පටුමගේ වරිපනම් අංක 18 දරන පරිශ්‍රය ද යන මායිම් තුල පිහිටියා වූ ද දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එම් 2999/49 යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද අංක 2712 දරන පිඹුරේ ලොට් අංක 1 ද අංක 670 දරන පිඹුරේ ලොට් අංක 1 සහ 1859 දරන පිඹුරේ ලොට් අංක "ඒ" ලෙස දක්වා ඇති මාර්ග අයිතිය ද සහිතව ප්‍රමාණයෙන් පර්චස් දොලහයි දශම තුනයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 12.31) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ද ඒ මත වූ ගොඩනැගිලි, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

කලාපීය කළමනාකරු,
කොළඹ දකුණ.

මහජන බැංකුව,
කලාප මූලස්ථානය - (බස්නාහිර කලාපය-01)
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

11-317

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පානදුර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විදානගමගේ ඉන්දික පියසිරි සහ
වතුතන්තිරිගේ යමනි ෂාලුක ද අල්විස්.

2010.09.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.09.18 සහ අංක 2114 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විදානගමගේ ඉන්දික පියසිරි සහ වතුතන්තිරිගේ යමනි ෂාලුක ද අල්විස් යන අයවලුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ

හතලිස්දෙදහස් පන්සිය හැත්තෑහයයි ශත අනූහතර (රු. 4,42,576.94) ක මුදලක් 2010.08.24 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,42,576.94ක මුදලට 2010.08.25 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2114 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාර්ට් මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, තන්තිරිමුල්ල උප කාර්යාල සීමාවේ, මාලමුල්ලේ "මාලමුල්ල ස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් පිළියෙල කරන ලද 2004.12.11 දිනැති අංක 2812 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 37 දරන ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 2812හි ලොට් 43 (මීටර් 6 දිග පාර) න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 2812හි ලොට් 36න් ද, දකුණට : පිඹුරු අංක 2014හි ඉතිරි කොටස වන ලොට් 12න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 2812හි ලොට් 38න් ද මායිම් වූ එකී අංක 2812 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 10.28) විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 475/230 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද 2004.12.11 දිනැති අංක 2812 පිඹුරේ ලොට් 43, 44 සහ 45 වැඩිදුරටත් වෙන්කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

11-345/6

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.08.19 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. මහජන නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක සහ මහජන නොතාරිස් ජී. ඩී. අල්විස් විසින් පිළිවෙලින් සහතික කරන ලද 2007.11.19 හා 2001.09.27 දිනැති අංක 655 සහ 1347 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2010.07.15 දින තෙක් පොලිය වශයෙන් රුපියල් දාහත්ලක්ෂ විසිපන් දහස් තුන්සිය හතළිස් හතයි ශත පනහක (රු.17,25,347.50) මුදලක් සමග රුපියල් දාහතරලක්ෂ හැත්තෑ එක් දහස් හාරසිය හැත්තෑ දෙකයි ශත පනස් පහක (රු.14,71,472.55) මුදලක් මත වසරකට සියයට දාසය (16%) බැගින් පොලියක් ද, 2010.07.16 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හඳපාන්ගොඩ, කොටිගල, කොළඹ පාර පදිංචි ලලිත් කොඩිප්පිලිආරච්චි සහ සුමාලි සාගරිකා වැලිකන්න මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී උකස් බැඳුම්කරය මත අයවිය යුතු ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, උඩුගහපත්තුවේ පෝරුවදණ්ඩ උප කාර්යාලය, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ, කොටිගල ග්‍රාමයේ පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි ඇතුළු සියලු දේද සමග මැද ගොඩැල්ල හේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් සාදන ලද 1997 ජූලි 13 දිනැති අංක 750 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : අඩි පාර ද, (අඩි 3 ක් පළල) නැගෙනහිරට : ඩබ්. එම්. සිරිවර්ධන අප්පුහාමි හිමිකම් කියන එම ඉඩමේ කොටස ද, දකුණට : එම ඉඩමේ ජේ. ලූවිස් සිංඤෝ සහ අනෙක් අය හිමිකම් කියන කොටස ද, බස්නාහිරට : එම ඉඩමේ ඩබ්. එම්. තේනිස් සිංඤෝ හිමිකම් කියන කොටස සහ පාර ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් නවයයි දශම නවයයි අටක (අ. 0, රූ. 2, පර්. 9.98) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E115/99 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග අංක 750 දරන එකී පිඹුරේ දැක්වෙන අඩි 10 ක් පළල පාර සඳහා වෙන්කර ඇති කොටස පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත්,
කළමනාකරු.

ලංකා බැංකුව,
ඉංගිරිය.

11-327

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

මොහමඩ් මූසින් මොහමඩ් නවුෆර්.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක

පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 සැප්තැම්බර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ශලී කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 985 සහ 2008 අගෝස්තු මස 18 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ, අංක 78/80 දරන ස්ථානයේ මොහමඩ් මූසින් මොහමඩ් නවුෆර් යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2010.09.03 වැනි දිනට රුපියල් තිස්තුන්ලක්ෂ දහහත්දහස් හත්සිය අනූඑකකුත් ශත අසූහයක මුදලක් (රු. 33,17,791.86) වර්තමානයේ දී නේෂන්ට් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් තිස්තුන්ලක්ෂ දහහත්දහස් හත්සිය අනූඑකකුත් ශත අසූහයක (රු. 33,17,791.86) මුදලක් සහ 2010.09.03 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් විසිඅටලක්ෂ අසූදහස් හත්සිය අනූදෙකකුත් ශත විසිඅටක (රු. 28,80,792.28) මුදල මත 2010.09.04 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 29% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වේනොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක චරිත් සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, තල්පිටි දෙබැද්දේ පානදුර තොටමුණේ සරික්කමුල්ල පිහිටි ආඩින් ෆොරස්ට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. අබේපිටිය විසින් මැන සාදන ලද අංක 3909 සහ 2008 ජූලි මස 08 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ඉඩමට මායිම්, උතුරට : එම්. එස්. එම්. ජලාල්ඩීන් යන අයට අයිති පොදු සේවා මාවතේ වරිපනම් අංක 23 දරන ආඩින් ෆොරස්ට් නමැති ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : සුභායිර් ඇවනිව් ද, දකුණට : එම්. එල්. එම්. ඉෆ්තික් යන අයට අයිති සුභායිර් ඇවනිව් හි වරිපනම් අංක 19/28 නමැති ඉඩමේම ලොට් 1B ද, බස්නාහිරට : නදී සිල්වා යන අයට අයිති දෙවන පටුමගේ වරිපනම් අංක 29/32 දරන ආඩින් ෆොරස්ට් ඉඩමේ කොටසක් ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3909 දරන පිඹුර අනුව පර්චස් දහයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ඊට අයිති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ඉඩම වනාහි පහත විස්තර කරන ඉඩමේ නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ :-

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, තල්පිටි දෙබැද්දේ පානදුර තොටමුණේ සරික්කමුල්ල පිහිටි ආඩින් ෆොරස්ට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. අබේපිටිය විසින් මැන සාදන ලද අංක 3088 සහ 1997 අප්‍රේල් මස 23 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1A දරන බිම් කොටසට මායිම්, උතුරට : එම්. සී. සිත්ති නජී යන අය හිමිකම් කියන ආඩින් ෆොරස්ට්හි වරිපනම් අංක 29/25 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ඉහත අංක 3088 දරන පිඹුරේ ලොට් 1B ද, බස්නාහිරට : ජී. එච්. එම්. සම්සුදීන් විසින් හිමිකම් කියන ආඩින් ෆොරස්ට්හි වරිපනම් අංක 29/32 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3088 දරන පිඹුර අනුව පර්චස් දහයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ඊට අයිති ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් සමග ය. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F315/226 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-363/2

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

මිල්ලවිතාන ආරච්චිගේ චමින්ද මදනායක.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 සැප්තැම්බර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දේව මනෝහරන් ස්වාමිනාදන් විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කර" වශයෙන් හඳුන්වනු ලබන) අංක 6112 සහ 2004 ඔක්තෝබර් මස 04 වැනි දින දරන මූලික උකස් බැඳුම්කරය සහ අංක 6604 සහ 2005 ඔක්තෝබර් මස 25 වැනි දින දරන ද්විතීයික උකස් බැඳුම්කරය සහ අංක 6968 සහ 2006 ඔක්තෝබර් මස 18 වැනි දින තෘතීයික උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) අංගොඩ, කැළණිමුල්ල, සිරිසුමන මාවතේ, අංක 263/3 දරන ස්ථානයේ පදිංචි මිල්ලවිතාන ආරච්චිගේ චමින්ද මදනායක යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

තවද ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කර මත 2010.08.11 වැනි දිනට රුපියල් විසිහත්ලක්ෂ හතලිස් එක්දහස් දෙසිය විසි අටකුත් ශත හැත්තෑවක මුදලක් (රු. 27,41,228.70) වර්තමානයේ දී නේෂන්ට් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් විසිහත්ලක්ෂ හතලිස්එක්දහස් දෙසිය විසිඅටකුත් ශත හැත්තෑවක මුදල (රු. 27,41,228.70) සහ පළමු නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් අටලක්ෂ හැත්තෑනවදහස් එකසිය හැත්තෑ හතකුත් ශත අටක මුදල (රු. 8,79,177.08) මත 2010.08.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21.80% බැගින් පොළිය ද දෙවන නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් පන්ලක්ෂ පනස්පන්දහස් හත්සිය දහසයකුත් ශත හතළිස්පහක මුදල (රු. 5,55,716.45) මත 2010.08.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 24% බැගින් තවදුරටත් පොළිය ද සහ තෙවන නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් දහතුන්ලක්ෂ හයදහස් තුන්සිය තිස්පහකුත් ශත දහහතක මුදල (රු. 13,06,335.17) මත වර්ෂයකට 24% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වේනොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි එම්. ඩබ්ලිව්. ත්‍රිවංක වරිත් සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලෙන් පහළ අලුත්කුරු කෝරළයේ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ කැළණිමුල්ලේ සිරිසුමන මාවතේ පිහිටි ඉඳිගහඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 1540 සහ 2003.09.21 වැනි දින දරන පිඹුර ප්‍රකාර වරිපනම් අංක 47/1 දරන බෙදා වෙන් කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම්, උතුරට : අංක 1519/96 දරන පිඹුරේ ලොට් 1A1 ද, නැගෙනහිරට : ලොට් 2 සහ 3 ද, දකුණට : 1519/96 දරන පිඹුරේ ලොට් 1B1 ද, බස්නාහිරට : අගල ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1540 දරන පිඹුර අනුව පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල බිම් කැබැල්ල සහ ගොඩනැගිලි ඇතුළුව ඊට අදාළ සෑම සියලු දේත් සමග ය.

තව ද ඉහත කී බිම් කැබැල්ලට ඉහත කී අංක 1540 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 දරන පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

11-363/1